වාර්ෂික වාර්තාව - 2020

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

කැලණිය විශ්වවිද්‍යාලය

දැක්ම

"ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනය සහ පර්යේෂණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම"

මෙහෙවර

"ජාතික හා ගෝලීය අවශ්‍යතාවන්ට සරිලන ආයුර්වේද වෛද්‍ය ක්‍රමය හා අනුබද්ධ විද්‍යාවන්, සායනික හා පර්යේෂණ දැනුමෙන් හා හැකියාවෙන් සැදුම්ලත් තරුණ තරුණයින් බිහි කිරීම"

අධ්‍යක්ෂකගේ සමාලෝචනය

2020 වසරේ වැදගත් සිදුවීම්



- ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" බවට පත් කිරීමේ අති විශේෂ ගැසට් පත්‍රය 2020 ඔක්තෝබර් මස 28 වැනි බදාදා දින නිකුත් කිරීම
- අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කමිටුවේ මූලිකත්වයෙන් බී.ඒ.එම්.එස්. උපාධි පාඨමාලාවේ වැඩසටහන් සමාලෝචනය 2020 පෙබරවාරි 11 දින සිට 14 දින දක්වා පැවැත්වීම
- 2020 ජනවාරි මස 25 වන දින පශ්චාත් උපාධි වැඩසටහන් සමාරම්භක උළෙල පැවැත්වීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මාර්ගගත (Online) ඉගැන්වීම වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් විශේෂ වැඩමුළුවක් පැවැත්වීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සංවර්ධන වැඩමුළුවක් පැවැත්වීම
- බී.ඒ.එම්.එස් සිසුන් සඳහා නායකත්ව සහ සන්නිවේදන හැකියාව පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම

අනාගත සැලසුම්

විද්‍යායතනයේ 2018 සිට 2020 වර්ෂ දක්වා වූ ආයතනික සැලැස්ම 2018.07.06 වැනි දින පැවති 257 වැනි කළමනාකරණ මණ්ඩලය මඟින් අනුමත කර ඇති අතර විද්‍යායතනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සමඟ එක්ව ශික්ෂණ හා ඉගෙනුම් ක්‍රියාකාරකම්, පර්යේෂණ කටයුතු, යටිතල පහසුකම් ගොඩනැංවීම මගින් එහි දැක්ම සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කර ඇත.

එමෙන්ම මෙම වසරේ දී පහත දැක්වෙන අරමුණු ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

අ) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් විශ්වවිද්‍යාල මට්ටමට උසස් කිරීමත් සමඟ කාර්යමණ්ඩල ඇස්තමේන්තුව (Cadre) අනුමත කර ගැනීම සහ ඒ අනුව අදාළ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම

ආ) නව පීඨ සහ නව දෙපාර්තමේන්තු පිහිටුවීම

ඇ) විද්‍යායතනය වටා ඇති ආසන්න ඉඩම් අත්කර ගැනීම

ඈ) නව පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කිරීම

ඉ) අධ්‍යයන ගොඩනැගිල්ලේ සහ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිරි වැඩ කටයුතු අවසන් කිරීම

ඊ) නව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා කිහිපයක් පොදු පෞද්ගලික හවුල්කාරිත්ව යෝජනා කැඳවා විශ්වවිද්‍යාල භූමියෙන් පිටත ස්ථාන කිහිපයක දී ආරම්භ කිරීමට කටයුතු සැළසුම් කිරීම

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
නිසි බලධාරී

අන්තර්ගතය

	ශීර්ෂ	පිටු අංකය
01.	ආයතනය පිළිබඳ හැඳින්වීම	
1.1	කෙටි හැඳින්වීම	01
1.2	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ සංවිධාන ව්‍යුහය	03
1.3	විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්	04
1.4	2020 වර්ෂය තුළ දී විද්‍යායතනයේ පැවති රැස්වීම් පිළිබඳ විස්තර	04
02.	උපාධි වැඩසටහන්වලට බඳවා ගත් නවක ශිෂ්‍යයින් (දේශීය) සහ ශිෂ්‍ය බඳවා ගැනීම (මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)	
2.1	අභ්‍යන්තර උපාධි වැඩසටහන්වලට දේශීය ශිෂ්‍යයින් බඳවා ගැනීම	05
2.2	අභ්‍යන්තර උපාධි වැඩසටහන්වලට දේශීය ශිෂ්‍යයින් බඳවා ගැනීම (2020.12.31 දිනට මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)	05
03.	පශ්චාත් උපාධි සහ වෙනත් විස්තාරණ වැඩසටහන්වලට ඇතුළු වූ නව දේශීය ශිෂ්‍යයින් සහ මුළු ශිෂ්‍ය බඳවා ගැනීම (2020 වර්ෂය)	06
04.	අභ්‍යන්තර උපාධි සමත් සංඛ්‍යාව	
4.1	ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය	06
4.2	පශ්චාත් උපාධි සහ වෙනත් පාඨමාලා	07
05.	මානව සම්පත් දත්ත	
5.1	අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය	08
5.2	අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය - අධ්‍යයන කාර්ය මණ්ඩලය	09
5.3	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළම සුදුසුකම් - 2020	09
5.4	විධායක නිලධාරීන් පිළිබඳ විස්තර	10
5.5	අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර - 2020	10
5.6	2020 වර්ෂයේ දී කාර්ය මණ්ඩලයට හිමි වූ විදේශ ශිෂ්‍යත්ව, අධි සාමාජිකත්ව, පුහුණු වැඩසටහන් සහ සම්පත් දායකත්වය	10
5.7	2020 වර්ෂයේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලය ලියාපදිංචි වූ / සම්පූර්ණ කළ පශ්චාත් උපාධි පාඨමාලා	11
06.	පර්යේෂණ නිමැවුම් දත්ත	
6.1	2020 වර්ෂයේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ ප්‍රකාශන සංඛ්‍යාව	11
6.2	2020 වර්ෂයේ දී පැවැති පුහුණු වැඩසටහන් / වැඩමුළු / ආරාධිත දේශන පිළිබඳ විස්තර	12
6.3	2020 වර්ෂය තුළ මහජනතාවට දැනුම බෙදාහැරීම පිළිබඳ විස්තර	14
6.4	ලැබූ සම්මාන පිළිබඳ විස්තර	15

	ශීර්ෂ	පිටු අංකය
අන්තර්ගතය	07. මූල්‍ය දත්ත	
	7.1 2019 සහ 2020 වර්ෂවල මුළු ආදායම (රු.)	16
	7.2 2020 වර්ෂයේ දී ප්‍රාග්ධන වියදම (රු.)	16
	7.3 2020 වර්ෂයේ දී පුනරාවර්තන වියදම් (රු.)	16
	7.4 පර්යේෂණ ව්‍යාපෘති උපයෝජනය සඳහා අරමුදල් විස්තර - 2020	17
	08. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2020	17
	09. 2020 වර්ෂයේ දී ලැබූ යටිතල පහසුකම් විස්තර	17
	10. නේවාසිකාගාර දත්ත - 2020	
	10.1 ස්ථිර කාන්තා නේවාසිකාගාර	17
	10.2 කුලියට ගත් නිවාස පහසුකම්	17
	11. මහපොළ සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව දත්ත	18
	12. 2020 වර්ෂයේ පුස්තකාල දත්ත	
	12.1 2020 වර්ෂයේ ග්‍රන්ථ සම්පත් පිළිබඳ තොරතුරු	18
	12.2 2020 වර්ෂයේ පුස්තකාල දඩ	18
	12.3 2020.01.01 සිට 2020.12.31 දක්වා පුස්තකාල පරිශීලක දත්ත	18
	13. මූල්‍ය ප්‍රකාශන	19
	14. තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව	39
	15. විගණකාධිපති වාර්තාව	44
	16. 2020 වසරේ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	50

01. ආයතනය පිළිබඳ හැඳින්වීම

1.1 කෙටි හැඳින්වීම

ආයුර්වේද වෛද්‍ය සිසුන් හට අෂ්ටාංග ආයුර්වේද ක්‍රමය පිළිබඳ න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබා දීමේ සහ ජාත්තීය වටිනාකම් ගොඩනැගීමේ පරමාර්ථ ඇතිව සියනෑ කෝරළයේ ප්‍රසිද්ධ වෙද පරපුරක් වූ නැදුන්ගමුවේ වෙද පරපුරේ ජන්ම ලාභය ලැබූ ආයුර්වේද චක්‍රවර්ති, පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි මැතිඳුන් විසින් ශ්‍රී ලංකාව තුළ පාරම්පරිකව පැවත එා වට්ටෝරු වෙදකම ක්‍රියාත්මක පැවති යුගයක ගම්පහ ආයුර්වේද වෛද්‍ය සංගමයේ ආරාධනය පරිදි වර්ෂ 1929 ජූලි මස 19වැනි දින "ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය" පිහිටුවන ලදී.

විද්‍යාලය මඟින් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට සහ මහජනතාවට ඉටු කළ විශිෂ්ට දායකත්වය හා සේවය හේතුවෙන් 1951 වර්ෂයේ නිකුත් කළ ගැසට් නිවේදනයක් මඟින් විද්‍යාලය රාජ්‍ය හිමිකාරත්වය ඇති ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. එම කාලයේ දී විද්‍යාලය මඟින් ප්‍රදානය කළ ඩිප්ලෝමාව සඳහා ඉහළ පිළිගැනීමක් හිමි වූ අතර ඩිප්ලෝමාධාරීන්ට රාජ්‍ය අංශයේ ආයුර්වේද රෝහල්වල සේවානියුක්තිය ලැබීමට සුදුසුකමක් විය. විද්‍යාලයේ උසස් අධ්‍යාපන ප්‍රමිතිය සහ මහජනතාවට ඉටු කළ විශිෂ්ට සේවාව පිළිගනිමින් 1982 වර්ෂයේ දී පාර්ලිමේන්තු පනතක් මඟින් විද්‍යාලය සංස්ථාපනය කරනු ලදුව දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ 'ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය' ලෙස නැවත නම් කරන ලදී.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ බලතල ප්‍රකාරව 1995 වර්ෂයේ දී එය විශ්වවිද්‍යාල ආයතනයක තත්ත්වයට උසස් කරන ලද අතර ඒ අනුව 'ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය' නාමය යටතේ පහතින් දැක්වෙන කාර්යභාර්යයන් ඉටු කරනු ලැබේ.

අ) ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (BAMS) ප්‍රදානය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තෝරා ගත් ශිෂ්‍යයින් බඳවා ගැනීම

ආ) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය තුළ උපාධි අපේක්ෂක පුහුණුව ලබා දීම

ඇ) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය තුළ ශික්ෂණයේ හා පර්යේෂණයේ කාර්ය සඳහා ගුරුවරුන්, විද්වතුන්, ශිෂ්‍යයින් හෝ වෙනත් හුවමාරු කිරීම

ඈ) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සහතිකපත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම

ඉ) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තාක්ෂණික සහයෝගය හා උපදේශන සේවා සැපයීම

ඊ) ආයුර්වේදය සහ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම

උ) ප්‍රජාව තුළ සෞඛ්‍ය රැකවරණ ප්‍රතිපාදන ක්‍රියාකාරකම් සිදු කිරීම

ඌ) මහජනතාවට හා පාසැල් ශිෂ්‍යයින්ට පර්යේෂණ ප්‍රකාශන, දේශන හා සාකච්ඡා හරහා දැනුම බෙදා දීම

එ) පර්යේෂණ පරිසංවාද, ශාස්ත්‍රීය සැසි ආදිය හරහා විද්‍යාත්මක දැනුම බෙදාහැරීම

අද වන විට ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය ශ්‍රී ලංකාවේ ඇති ප්‍රමුඛ ආයුර්වේද ආයතනයකි. එය කොළඹින් කි.මී. 30ක් පමණ ඈතින් කොළඹ නුවර ප්‍රධාන මාර්ගය ආසන්නයේ යක්කල නගරයේ පිහිටා ඇත. ප්‍රධාන අධ්‍යයන හා පරිපාලන පරිශ්‍ර යක්කල අක්කර 7ක භූමි භාගයක පිහිටා ඇති අතර ආයුර්වේද ඖෂධ උයන වතුපිටිවල, යකඩවල අක්කර 5 ක භූමි භාගයක පිහිටා ඇත.

විද්‍යායතනය විසින් වසර පහක අධ්‍යයන වැඩසටහනකින් සහ වසරක ආධුනික කාලපරිච්ඡේදයකින් සැදුම්ලත් ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී පිළිබඳ උපාධිය (BAMS) පිරිනමනු ලැබේ.

විද්‍යායතනයයට අධ්‍යයන අංශ පහක් ඇතුළත් වේ: එනම් ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය, චිකිත්සා අධ්‍යයන අංශය, ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය, ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශය හා කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය එම අධ්‍යයන අංශ වේ.

පශ්චාත් උපාධි අධ්‍යයන අංශය, පර්යේෂණ හා ප්‍රකාශන ඒකකය, වෛද්‍ය අධ්‍යාපනය ඒකකය, පුස්තකාලය, නවීන අංගෝපාංගවලින් සැදුම්ලත් විද්‍යාගාරය, පිළිවෙලින් 300ක හා 150ක පිරිසකට අසුන් ගැනීමේ පහසුකම් සපයන ශ්‍රවණාගාරය හා කුඩා ශ්‍රවණාගාරය සහ ක්‍රීඩාගාරය යන අංගවලින් විද්‍යායතනයේ කටයුතු තවදුරටත් ශක්තිමත් කර ඇත.

එමෙන්ම පරිගණක 100කින් සැදුම්ලත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් BAMS උපාධි පාඨමාලාවේ Level I, Level III, සහ Level IV හි විෂයක් ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විෂය (2 Credits) ඉගැන්වීම, විද්‍යුත් තැපැල් පහසුකම් සහ LEARN ආයතනයෙන් ලබා ගන්නා ලද අන්තර්ජාල පහසුකම් ලබා දීම සහ නඩත්තු කිරීම, විද්‍යායතනයේ අභ්‍යන්තර ජාල පද්ධතීන් සහ LMS පද්ධතිය නඩත්තු කිරීම, විද්‍යායතනයේ වෙබ් පිටුව අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීම, විද්‍යායතනයේ වැඩමුළු, පුහුණු වැඩසටහන් ආදී වැඩසටහන්වලට අදාළ තොරතුරු සහ ඡායරූප විද්‍යායතනයේ වෙබ් පිටුවට ඇතුළත් කිරීම වැනි සේවා සැපයීම තුළින් විද්‍යායතනයේ කටයුතුවලට විශාල දායකත්වයක් දක්වනු ලැබේ.

විද්‍යායතනයේ කාන්තා නේවාසිකාගාර සංකීර්ණය යක්කල ප්‍රධාන පරිශ්‍රයේ සිට මීටර 500ක දුරින් වීදියවත්තේ පිහිටා ඇත. එමෙන්ම තාවකාලිකව බදු පදනම මත ලබා ගත් නිවාස 07ක් (ජයතිලක නේවාසිකාගාරය, සෙනෙවිරත්න නේවාසිකාගාරය, රන්වැලි නේවාසිකාගාරය, කෙසෙල්වතුගොඩ නේවාසිකාගාරය, මහවිට නේවාසිකාගාරය, පරාක්‍රම නේවාසිකාගාරය, කරුණානායක නේවාසිකාගාරය) උපයෝගී කර ගනිමින් සිසු සිසුවියන් වෙත නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.

2020 වර්ෂයේ දී මෙම විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි මුළු උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව 519කි.

1.2 ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ සංවිධාන ව්‍යුහය



1.3 විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්

	සාමාජිකයාගේ නම	කාල සීමාව
01. නිල බලයෙන් පත් වූ සාමාජිකයින්	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මහත්මිය නිසි බලධාරී	2020.01.15-2021.02.28
	ජේ.ඒ.අයි.ඒ. පෙරේරා මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය	2020.01.15-2021.02.28
	ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	2020.01.15-2021.02.28
	වෛද්‍ය කේ.පී. හෙට්ටිආරච්චි මහත්මිය අධ්‍යක්ෂ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල	2020.01.15-2021.02.28
	මහාචාර්ය ජානකී ද එස්. හේවාවිසේන්ති මහත්මිය පීඨාධිපති, වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය	2020.01.15-2021.02.28
	වෛද්‍ය පී. විතාරණ මහතා අංශ ප්‍රධාන, චිකිත්සා අධ්‍යයන අංශය	2020.01.15-2021.02.28
	ආචාර්ය කේ.පී.පී. පීරිස් මහත්මිය අංශ ප්‍රධානී, ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අංශය	2020.01.15-2021.02.28
02. ආයුර්වේද වෛද්‍ය සභාව නම් කළ නිලධාරීන්	වෛද්‍ය බැසිල් රංජිත් ප්‍රනාන්දු මහතා	2020.01.15-2021.02.28
	වෛද්‍ය ඩී.පී.පී. විජේරත්න මහතා	2020.01.15-2021.02.28
03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයින්	ඒ.ඩී. වික්‍රමාරච්චි මහත්මිය	2020.01.15-2021.02.28
	ආර්.කේ.ඒ. රණවීර මහතා	2020.01.15-2021.02.28
	මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න මහතා	2020.01.15-2021.02.28
	මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මහත්මිය	2020.01.15-2021.02.28
	සුනිල් ජයලත් මහතා	2020.01.15-2021.02.28
	වෛද්‍ය පී.ඩබ්.ඩබ්. දිසානායක මහතා	2020.01.15-2021.02.28
	වෛද්‍ය පී.කේ.එච්. ධර්මවිජය මහතා	2020.01.15-2021.02.28
	වෛද්‍ය ඩබ්.පී.එස්.පී. විජේරත්න මහතා	2020.01.15-2021.02.28
	වෛද්‍ය ඕ.ඒ.ඒ.එස්. බණ්ඩාර මහතා	2020.01.15-2021.02.28
04. මණ්ඩලයේ ලේකම්	ඩී.එම්.ආර්.එස්. දසනායක මහත්මිය නියෝජ්‍ය ලේඛකාධිකාරී	2020.01.15-2021.02.28

1.4 2020 වර්ෂය තුළ දී විද්‍යායතනයේ පැවති රැස්වීම් පිළිබඳ විස්තර

රැස්වීමේ නම	2020 වසරේ පැවති රැස්වීම් සංඛ්‍යාව
කළමනාකරණ මණ්ඩලය	06
අධ්‍යයන මණ්ඩලය (ප්‍රථම උපාධි)	05
මූල්‍ය කමිටුව	03
විගණන කමිටුව	03
අධ්‍යයන මණ්ඩලය (පශ්චාත් උපාධි)	02

02. උපාධි වැඩසටහන්වලට බඳවා ගත් නවක ශිෂ්‍යයින් (දේශීය) සහ ශිෂ්‍ය බඳවා ගැනීම (මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)

2.1 අභ්‍යන්තර උපාධි වැඩසටහන්වලට දේශීය ශිෂ්‍යයින් බඳවා ගැනීම

අධ්‍යයන වැඩසටහන	බඳවා ගැනීම් වර්ෂය	එකඟ වූ බඳවා ගැනීම	ලියාපදිංචි කළ සත්‍ය සංඛ්‍යාව
ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය (BAMS)	2016	120	79
	2017	120	78
	2018	120	109
	2019	120	111
	2020	120	106



2.2 අභ්‍යන්තර උපාධි වැඩසටහන්වලට දේශීය ශිෂ්‍යයින් බඳවා ගැනීම (2020.12.31 දිනට මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)

අධ්‍යයන වැඩසටහන	මාධ්‍ය	අධ්‍යයන මට්ටම					
		අදියර I	අදියර II	අදියර II (සමාසිකය I)	අදියර III (සමාසිකය II)	අදියර IV	අදියර V
ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය (BAMS) 2018 / 2019	සිංහල	104	91	104	-	-	-
ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය (BAMS) 2017 / 2018	සිංහල	-	-	-	68	66	86

03. පශ්චාත් උපාධි සහ වෙනත් විස්තාරණ වැඩසටහන්වලට ඇතුළු වූ නව දේශීය ශිෂ්‍යයින් සහ මුළු ශිෂ්‍ය බඳවා ගැනීම (2020 වර්ෂය)

අධ්‍යයන වැඩසටහන	නවක ශිෂ්‍යයින්	මුළු ශිෂ්‍ය බඳවා ගැනීම් (2020) (ලියාපදංචි කළ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)
ආයුර්වේද ආයතනවල කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව	36	36
ආයුර්වේද ආයතනවල කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	21	21
පංචකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	08	08
කායචිකිත්සා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	17	17
ශල්‍යාතන්ත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	19	19

04. අභ්‍යන්තර උපාධි සමත් සංඛ්‍යාව

4.1 ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය

අධ්‍යයන වැඩසටහන	විභාගයේ නම	අවසාන පරීක්ෂණය ට මුහුණ දුන් සංඛ්‍යාව	පළමු පන්තිය	දෙවැනි පන්තිය (ඉහළ)	දෙවැනි පන්තිය (පහළ)	සමත්	සමත් මුළු සංඛ්‍යාව	
ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය (BAMS) 2018	2014/2015 අතිරේක පරීක්ෂණය	20	-	01	03	16	20	**20**
ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය (BAMS) 2019	2015/2016 (11 සමාසික) පරීක්ෂණය	81	02	22	14	22	60	**80**
	2015/2016 අතිරේක පරීක්ෂණය	21	-	02	03	11	16	
	2016/2017 (1 සමාසික) පරීක්ෂණය	05	-	-	-	04	04	
ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය (BAMS) 2020	2016/2017 (11 සමාසික) පරීක්ෂණය	69	-	18	06	24	48	**64**
	2016/2017 අතිරේක පරීක්ෂණය	21	-	02	01	13	16	

4.2 පශ්චාත් උපාධි සහ වෙනත් පාඨමාලා

අධ්‍යයන වැඩසටහන	උපාධිය ලබා ගත් මුළු සංඛ්‍යාව
ආයුර්වේද ආයතනවල කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව	12*
ආයුර්වේද ආයතනවල කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	-
කායචිකිත්සා විද්‍යාපති පාඨමාලාව	06*
කායචිකිත්සා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	08*
පංචකර්ම විද්‍යාපති පාඨමාලාව	07*
පංචකර්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	25*
ශල්‍යතන්ත්‍ර පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	14*

* පෙර වර්ෂවල ලියාපදිංචි වූ අපේක්ෂකයින් අවසන් නිබන්ධන ලබා දීමෙන් පසු සමත් වී ඇත.

ඩිප්ලෝමා පාඨමාලා

පාඨමාලාවේ නම	අවසාන පරීක්ෂණයට ලියාපදිංචි වූ ගණන	සමත් ගණන
යෝග හා සංයම අභ්‍යාස පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	28	26

05. මානව සම්පත් දත්ත

5.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය

සේවා මට්ටම	කාර්ය මණ්ඩල කාණ්ඩය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	වර්තමාන ස්ථිර කාර්ය මණ්ඩල සංඛ්‍යාව			තාවකාලික කාර්ය මණ්ඩල සංඛ්‍යාව			ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු	තථ්‍ය සේවක සංඛ්‍යා පුරප්පාඩු
				පිරිමි	කාන්තා	එකතුව	පිරිමි	කාන්තා	එකතුව		
			(1)			(2)			(3)	(1)-(2)	(1)-(2)-(3)
ජ්‍යෙෂ්ඨ මට්ටම	අධ්‍යයන කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) කථිකාචාර්ය ආධුනික කථිකාචාර්ය	U-AC 3සිට U-AC 5	**50**	13	22	35*				15	13
	පුස්තකාල කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිකාරී සහකාර පුස්තකාලාධිකාරී	U-AC 3	**02**	1	 1	1 1					
	පරිපාලන හා මූල්‍ය (විධායක) කාර්ය මණ්ඩලය	U-EX 2	**03**	2	1	3					
තෘතීක මට්ටම	අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	U-AS 2	**4**	2	1	3					
		U-AS 1			1	1					
	තාවකාලික කථිකාචාර්ය තාවකාලික ප්‍රදර්ශක තාවකාලික පර්යේෂක සහායක	U-AC 1 සිට U-AC 2	**14** **1**	1 1	1	2 1				14	14
	පරිපාලන හා මූල්‍ය (විධායක) කාර්ය මණ්ඩලය	U-EX 1	**2**	1	1	2					
	වෙනත් විධායක කාර්ය මණ්ඩලය	U-EX 1	**1**	1		1					
ද්විතීක මට්ටම	තාක්ෂණික කාර්ය මණ්ඩලය	U-EX 2	**16**							3	3
		U-EX 1									
		U-MN 4		1	1	2					
		U-MN 3									
		U-MN 2									
		U-MT 1		8	2	10					
	කළමනාකරණ සහකාර සහ සමාන්තර ශ්‍රේණි	U-MN 4	**51**	6	21	27					
		U-MN 3		1	1	2					
		U-MN 2		0	1	1					
		U-MN 1		8	13	21					
ප්‍රාථමික මට්ටම	ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 3	**14**	17	1	18				2	2
		U-PL 2	**10**	1	2	3				3	3
		U-PL 1	**35**	13	9	22				11	11

* නිසි බළධාරි තනතුර තාවකාලික පත් වීමක් බැවින් අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තථ්‍ය කාර්ය මණ්ඩලයට නිසි බළධාරිතුමිය ඇතුළත් කර නැත.

5.2 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය – අධ්‍යයන කාර්ය මණ්ඩලය

අධ්‍යයන කාර්ය මණ්ඩලය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	වර්තමාන ස්ථිර කාර්ය මණ්ඩල සංඛ්‍යාව			තාවකාලික කාර්ය මණ්ඩල සංඛ්‍යාව			ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු	තථ්‍ය සේවක සංඛ්‍යා පුරප්පාඩු
			ස්ථිර	කාන්තා	එකතුව	ස්ථිර	කාන්තා	එකතුව		
		(1)			(2)			(3)	(1)-(2)	(1)-(2)-(3)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I වැනි ශ්‍රේණිය	U-AC 3(I)	**49**	6	5	11				15	13
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වැනි ශ්‍රේණිය	U-AC 3(II)		4	9	13					
කථිකාචාර්ය	U-AC 3(III)		3	5	8					
පරිවාස කථිකාචාර්ය	U-AC 3(IV)		0	3	3					
තාවකාලික කථිකාචාර්ය / සහකාර කථිකාචාර්ය	U-AC 2	-				1	1	2		
තාවකාලික පර්යේෂණ සහායක	U-AC 2	**1**				1		1		
තාවකාලික ප්‍රදර්ශක	U-AC 1	**14**							14	14
එකතුව		**64**	**13**	**22**	**35**	**2**	**1**	**3**	**29**	**27**

5.3 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළම සුදුසුකම් – 2020

සුදුසුකම්	අධ්‍යයන අංශයේ නම					
	ආයුර්වේද මූලධර්ම	කෞමාර භෘත්‍ය සහ ස්ත්‍රී රෝග	ද්‍රව්‍යගුණ විඥාන	චිකිත්සා	ශල්‍ය ශාලාක්‍ය	එකතුව
දර්ශනශූරී/ උසස් වෛද්‍ය උපාධිය/ එම් එස්	03	03	06	06	02	**20**
දර්ශනපති	03	-	03	-	-	**06**
ශාස්ත්‍රපති	01	-	-	-	-	**01**
විද්‍යාපති	-	02	-	02	01	**05**
ප්‍රථම/ ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය	02	-	01	-	-	**03**
එකතුව	**09**	**05**	**10**	**08**	**03**	**35**

5.4 විධායක නිලධාරීන් පිළිබඳ විස්තර

වර්ගය	2020		
	අනුමත	තත්‍ය	පුරප්පාඩු
අධ්‍යක්ෂ	01	00	01*
පරිපාලන කාර්ය මණ්ඩලය	05	05	-
අනෙකුත් කාර්ය මණ්ඩලය	01	01	-

* අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩුවක් පැවතිය ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් තාවකාලික පදනමින් නිසි බලධාරිතුමියක් පත් කර ඇත.

5.5 අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර - 2020

අධ්‍යයන අංශය / අංශය / ඒකකය	කළමනාකරණ සහකාර සහ සමාන්තර ශ්‍රේණි	තාක්ෂණික හා සමාන්තර ශ්‍රේණි	ප්‍රාථමික කාර්ය මණ්ඩලය	එකතුව
අධ්‍යක්ෂ කාර්යාලය	01	-	01	02
පරිපාලන අංශය	15	01	08	24
විභාග හා ශිෂ්‍ය සුභසාධන අංශය	09	-	02	11
මූල්‍ය අංශය	12	-	01	13
ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය	02	02	04	08
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය	01	01	01	03
ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය	02	01	02	05
ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අංශය	01	01	01	03
චිකිත්සා අධ්‍යයන අංශය	02	03	01	06
පුස්තකාලය	03	01	05	09
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය	-	01	01	02
විද්‍යා හා තාක්ෂණ අංශය	-	02	02	04
නඩත්තු අංශය	03	-	13	16
ශාරීරික අධ්‍යාපන ඒකකය	-	-	01	01
එකතුව	**51**	**12**	**43**	**107**

5.6 2020 වර්ෂයේ දී කාර්ය මණ්ඩලයට හිමි වූ විදේශ ශිෂ්‍යත්ව, අධි සාමාජිකත්ව, පුහුණු වැඩසටහන් සහ සම්පත් දායකත්වය

අධ්‍යයන අංශය / අංශය / ඒකකය	තනතුර	වැඩසටහන් වර්ගය	ලැබූ කාර්ය මණ්ඩල සංඛ්‍යාව / ඉලක්කගත කණ්ඩායම
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය	කථිකාචාර්ය	වෛද්‍ය - රෝහල් සායනික පුහුණුව (ළමා රෝග)	02
ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය	කථිකාචාර්ය (පරිවාස)	ආයුෂ් පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව 2020-2021 (ඉන්දීය රාජ්‍ය අනුග්‍රහයෙන්)	01

5.7 2020 වර්ෂයේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලය ලියාපදිංචි වූ / සම්පූර්ණ කළ පශ්චාත් උපාධි පාඨමාලා

අධ්‍යයන අංශය	අධ්‍යයන පාඨමාලාව	ලියාපදිංචි වූ කාර්ය මණ්ඩල සංඛ්‍යාව	සම්පූර්ණ කළ කාර්ය මණ්ඩල සංඛ්‍යාව
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය	වෛද්‍ය	02	00

06. පර්යේෂණ නිමැවුම් දත්ත

6.1 2020 වර්ෂයේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ ප්‍රකාශන සංඛ්‍යාව

අධ්‍යයන අංශය / අංශය / ඒකකය	ප්‍රකාශන	දේශීය	අන්තර්ජාතික
ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය	සාරාංශ ප්‍රකාශන සංඛ්‍යාව	14	07
	ප්‍රකාශකයා විසින් ප්‍රකාශිත ග්‍රන්ථ සංඛ්‍යාව	01	
	සූචිගත වාර සඟරාවල පළ කළ සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		17
	ප්‍රකාශන ලිපි සංඛ්‍යාව		01
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය	සූචිගත වාර සඟරාවල පළ කළ සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		04
	ප්‍රකාශන ලිපි සංඛ්‍යාව	01	
ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය	සාරාංශ ප්‍රකාශන සංඛ්‍යාව		01
	ප්‍රකාශන ලිපි සංඛ්‍යාව		01
චිකිත්සා අධ්‍යයන අංශය	සාරාංශ ප්‍රකාශන සංඛ්‍යාව	08	
	කර්තෘ විසින් ප්‍රකාශිත ග්‍රන්ථ සංඛ්‍යාව	01	
	සූචිගත වාර සඟරාවල පළ කළ සම්පූර්ණ ලිපි සංඛ්‍යාව	03	16
ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අංශය	සූචිගත වාර සඟරාවල පළ කළ සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		05
විද්‍යා හා තාක්ෂණ ඒකකය	සූචිගත වාර සඟරාවල පළ කළ සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		01
පුස්තකාලය	ප්‍රකාශිත ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව	01	
	ප්‍රකාශකයා විසින් ප්‍රකාශිත ග්‍රන්ථ සංඛ්‍යාව	01	
	සූචිගත වාර සඟරාවල පළ කළ සම්පූර්ණ ලිපි සංඛ්‍යාව	01	

6.2 2020 වර්ෂයේ දී පැවති පුහුණු වැඩසටහන් / වැඩමුළු / ආරාධිත දේශන පිළිබඳ විස්තර

අධ්‍යයන අංශය / අංශය/ ඒකකය	වැඩසටහනේ මාතෘකාව සහ සම්පත්දායකයා	දිනය සහ වේලාව	ඉලක්කගත කණ්ඩායම
ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අංශය	යාවත්කාලීන ශාලාක්‍යතන්ත්‍ර පිළිබඳ ජාත්‍යන්තර මාර්ගගත පුහුණු සැසිය - 2020 (කේ ආචාර්ය.පී.පී පිරිස්)	2020.11.09 ප.ව. 1.00 සිට ප.ව. 3.30 දක්වා	උපාධි සිසුන් පශ්චාත් උපාධි සිසුන්
	ශාලාක්‍ය විද්‍යාධාරා - 2020 පළමු ජාත්‍යන්තර මාර්ගගත පුහුණු සැසිය - II දේශණය - 8 (ආචාර්ය කේ.පී.පී. පිරිස්)	2020.06.26 පෙ.ව. 8.00 සිට 9.00 දක්වා	උපාධි සිසුන් පශ්චාත් උපාධි සිසුන්
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය	වාණිජ්‍යමය වශයෙන් ‘‘කටරොළු ශාකය’’ වගා කිරීම පිළිබඳව හඳුන්වාදීමේ වැඩසටහන වෛද්‍ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ		අපේකම සංවිධානය, වල්ගම්මුල්ල, ඌරාපොල
	‘‘සොබාකෙත’’ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා වැඩසටහන වෛද්‍ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ	2020.04.12	දිවයිනෙහි සියලු දෙනා
	‘‘කොවිඩ් ’’ වසංගතය වැළැක්වීම පිළිබඳ වැඩසටහන - ස්වාධීන රූපවාහිණිය වෛද්‍ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ	2020.04.19	දිවයිනෙහි සියලු දෙනා
	‘‘වෙද ගෙදර’’ බාල චිකිත්සාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - ස්වාධීන රූපවාහිණිය වෛද්‍ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ	2020.07.31	දිවයිනෙහි සියලු දෙනා
ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය	ශාස්ත්‍රීය සංවාද	නොවැම්බර්/ දෙසැම්බර්	උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරු
	යෝග හා සංයම අභ්‍යාස ඩිප්ලෝමා පාඨමාලාව	2020 අගෝස්තු මස සිට ඔක්තෝබර් දක්වා	අදාළ පාඨමාලාවේ සිසුන්
ක්‍රීඩා ඒකකය	ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ක්‍රීඩා දිනය (ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය සහ කැලණිය විශ්වවිද්‍යාලය එකට එක්ව ලංකාව තුළ ප්‍රථම වතාවට සංවිධානය කිරීම)	2020.09.20 දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා	ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වල ක්‍රීඩා කටයුතු වල නිරත ක්‍රීඩක ක්‍රීඩිකාවන්

අධ්‍යයන අංශය / ඒකකය	වැඩසටහනේ මාතෘකාව සහ සම්පත්දායකයා	දිනය සහ වේලාව	ඉලක්කගත කණ්ඩායම
පුස්තකාලය	පාසල් ශිෂ්‍ය නායකන්ගේ එදිනෙදා කාර්යභාරය	2020.03.06 පෙ.ව. 8.30-11.30	6-13 වසරවල පාසල් ශිෂ්‍ය ප්‍රජාව
	පුස්තකාලයක් මනාව පවත්වා ගැනීම	2020.03.11 පෙ.ව. 8.30 සිට ප.ව. 4.00	විශ්වවිද්‍යාලවල පුස්තකාල සහායක කාර්ය මණ්ඩලය
	දේශීය දැනුම සංරක්ෂනයේ දී මහජන පුස්තකාලයාධිපතිවරුන්ගේ කාර්යභාරය	2020.09.24 පෙ.ව. 8.30 සිට ප.ව. 4.00	වයඹ පළාත් වැඩමුළුව, පළාත් පාලන ආයතනවල පුස්තකාල කාර්ය මණ්ඩලය
	ඔබ ම, අලෙවි කරගන්නේ කෙසේ ද?	2020.09.25 පෙ.ව. 10.00-12.00	පාසල් ශිෂ්‍ය ප්‍රජාව වයඹ විශ්වවිද්‍යාලයේ දී
	පුස්තකාලයක ග්‍රන්ථ වර්ගීකරණය	2020.09.27 ප.ව.1.00-3.30	පාසල් පුස්තකාලයාධිපතිවරු ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම
ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය	කර්මාන්තශාලා පුහුණු වැඩසටහන	2020.01.07 සිට 2020.01.09	බී.ඒ.එම්.එස්. III මට්ටමේ II සෙමෙස්තර සිසුන්
	ශාක නිදර්ශක සකස් කිරීම පිළිබඳ වැඩමුළුව - පේරාදෙණිය	2020.01.02 පෙ.ව. 9.00 - ප.ව. 4.00	බී.ඒ.එම්.එස්. II මට්ටමේ II සෙමෙස්තර සිසුන්
	පටක රෝපණ වැඩමුළුව උද්භිත උද්‍යානය (ගම්පහ)	2020.01.13 පෙ.ව. 9.00 - ප.ව. 4.00	බී.ඒ.එම්.එස්. II මට්ටමේ II සෙමෙස්තර සිසුන්
	විෂය නිර්දේශ හා පාඨමාලා සංවර්ධන වැඩමුළුව	2020.01.28 ප.ව. 1.00 - ප.ව. 4.00	ආචාර්ය මණ්ඩල සියලුම දෙනා
	විෂය නිර්දේශ හා පාඨමාලා සංවර්ධන වැඩමුළුව	2020.01.30 පෙ.ව. 9.00 - ප.ව. 4.00	ආචාර්ය මණ්ඩල සියලුම දෙනා
	පර්යේෂණවල ගුණාත්මකභාවය පිළිබඳ වැඩමුළුව - 01	2020.10.22	ආචාර්ය මණ්ඩල සියලුම දෙනා
	පර්යේෂණවල ගුණාත්මකභාවය පිළිබඳ වැඩමුළුව - 02	2020.10.22	ආචාර්ය මණ්ඩල සියලුම දෙනා
	එල්.එම්.එස්. වැඩමුළුව	2020.07.16 පෙ.ව. 9.00 - ප.ව. 12.00	ආචාර්ය මණ්ඩල සියලුම දෙනා
	මාර්ගස්ථ ඇගයීම් ක්‍රම පිළිබඳ වැඩමුළුව	2020.11.20, 2020.12.15 පෙ.ව. 9.00 - ප.ව. 12.00	ආචාර්ය මණ්ඩල සියලුම දෙනා
	සායනික පුහුණු වැඩසටහන	2020.08.24	IV, V මට්ටම් සිසුන්

ඉහත වැඩසටහන්වල වැදගත් අවස්ථාවන්



6.3 2020 වර්ෂය තුළ මහජනතාවට දැනුම බෙදාහැරීම පිළිබඳ විස්තර

අධ්‍යයන අංශය	වැඩසටහනේ නම	ඉලක්කගත කණ්ඩායම	සහභාගී වන්නන් සංඛ්‍යාව
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය	වාණිජ්‍යම වශයෙන් ‘‘කටරොළු ශාකය’’ වගා කිරීම පිළිබඳව හඳුන්වාදීමේ වැඩසටහන වෛද්‍ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ	බී.ඒ.එම්.එස්. සිසුන්	200
	‘‘සොබාකෙත’’ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා වැඩසටහන වෛද්‍ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ	මහජනතාව	දිවයිනෙහි සියලු දෙනා
	‘‘කොවිඩ් ’’ වසංගතය වැළැක්වීම පිළිබඳ වැඩසටහන - ස්වාධීන රූපවාහිනිය වෛද්‍ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ	මහජනතාව	දිවයිනෙහි සියලු දෙනා
	‘‘වෙද ගෙදර’’ බාල චිකිත්සාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - ස්වාධීන රූපවාහිනිය වෛද්‍ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ	මහජනතාව	දිවයිනෙහි සියලු දෙනා
ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය	අක්ෂි රෝග හා නිවාරණ උපාය (රූපවාහිනි වැඩසටහන) ආයුර්වේද අක්ෂි රෝග ප්‍රතිකාර විධි (රූපවාහිනි වැඩසටහන)	සාමාන්‍ය ජනතාව	PEO TV රූපවාහිනි ප්‍රේක්ෂකයින්
චිකිත්සා අධ්‍යයන අංශය	යෝග ප්‍රතිශක්තිකරණ භූමිකාව පිළිබඳ ජාත්‍යන්තර යෝග දින දී කළ මාර්ගගත දේශනය	සාමාන්‍ය ජනතාව	100
විද්‍යා හා තාක්ෂණ ඒකකය	විෂබීජ නාශනය සඳහා නිපදවූ පාරජම්බුල කිරණ නිකුත් කරන විදුලි ප්‍රභවයක් සහිත ජංගම රොබෝ යන්ත්‍රයක කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීම	සාමාන්‍ය ජනතාව	06
	නව නිපැයුමක් වූ ශාකසාර මුව ආවරණයක ප්‍රතික්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම	සාමාන්‍ය ජනතාව	03

ඉහත වැඩසටහන්වල වැදගත් අවස්ථාවන්













6.4 ලැබූ සම්මාන පිළිබඳ විස්තර

සම්මානය	අධ්‍යයන අංශය / අංශය/ ඒකකය	සම්මානයේ නම	සම්මානලාභීන්
සෙනෙට් ප්‍රධාන	කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය	සෙනෙට් ගෞරව ප්‍රදාන හා මුදල් ප්‍රදාන	ආචාර්ය එච්.පී. වක්කුඹුර මිය
		වසර 25 ක අඛණ්ඩ ප්‍රශංසනීය සේවය වෙනුවෙන් ලෝකඩ පදක්කම හා සහතික පත්‍රය	ආචාර්ය එච්.පී. වක්කුඹුර මිය
		වසර 25 ක අඛණ්ඩ ප්‍රශංසනීය සේවය වෙනුවෙන් ලෝකඩ පදක්කම හා සහතික පත්‍රය	වෛද්‍ය ඩබ්.එල්.ඒ. රාජිනී පුෂ්පකුමාරි මෙනෙවිය
උපකුලපති සම්මාන	චිකිත්සා අධ්‍යයන අංශය	වැඩිම පර්යේෂණ සංඛ්‍යාවක් ඉදිරිපත් කළ පරියේෂකයා	වෛද්‍ය කේ.ජී.සී. දිසානායක මිය
		විශිෂ්ඨතම ජ්‍යෙෂ්ඨ පර්යේෂක 2 වන ස්ථානය	වෛද්‍ය කේ.ජී.සී. දිසානායක මිය
උපකුලපති සම්මාන	ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අශය	විශිෂ්ඨතම ජ්‍යෙෂ්ඨ පර්යේෂක 1 වන ස්ථානය	ආචාර්ය කේ.පී.පී. පීරිස් මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය- I ශ්‍රේණිය)
		දීර්ඝ කාලීන සේවා (වසර 25 සැපිරීම)	එන්.බී.ඒ.එන්.එස්.ආර්.එස්. තලංගල්ල මිය
උපකුලපති සම්මාන	ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය	2020 වර්ෂයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ විශිෂ්ඨතම තරුණ පර්යේෂක - ප්‍රථම ස්ථානය	වෛද්‍ය එන්.එස්. අබේගුණසේකර මෙනවිය
		2020 වර්ෂයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ විශිෂ්ඨතම තරුණ පර්යේෂක - දෙවන ස්ථානය	වෛද්‍ය ජී.වී.පී. සමරනායක මිය
		2020 වර්ෂයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ විශිෂ්ඨතම තරුණ පර්යේෂක - තෙවන ස්ථානය	ඒ.කේ. හර්ෂ ධර්මප්‍රිය මහතා

07. මූල්‍ය දත්ත

7.1 2019 සහ 2020 වර්ෂවල මුළු ආදායම (රු.)

		වසර	
		2019	**2020**
පුනරාවර්තන ප්‍රදාන			
සේවක පාරිශ්‍රමිකය		265,045,000	326,414,000
වෙනත් පුනරාවර්තන		48,000,000	65,124,000
මහපොළ	භාණ්ඩාගාරය	734,000	-
	භාරය	705,600	-
ශිෂ්‍යාධාර ප්‍රදාන		5,250,330	7,652,430
එකතුව පුනරාවර්තන		**319,735,330**	**399,190,430**
ප්‍රාග්ධන ප්‍රදාන			
පුනරුත්ථාපනය හා ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම		20,515,000	48,250,000
ස්ථාවර වත්කම් අත්කර ගැනීම		25,655,000	13,750,000
ඉදිකිරීම් ව්‍යාපෘති		-	45,000,000
දැනුම වැඩිදියුණු කිරීම		330,000	1,000,000
එකතුව ප්‍රාග්ධන		**46,500,000**	**108,000,000**
උපයන ලද ආදායම්			
ස්වයං-මූල්‍යකරණ කටයුතු		7,709,677	13,536,282
අනෙකුත් සියලුම අභ්‍යන්තර ආදායම්		21,446,116	20,270,990
එකතුව		**29,155,793**	**33,807,272**

7.2 2020 වර්ෂයේ දී ප්‍රාග්ධන වියදම (රු.)

විස්තරය	රජයේ ප්‍රදානය	මුළු වියදම
ඉදිකිරීම් ව්‍යාපෘති අධ්‍යයන ගොඩනැගිල්ල	45,000,000	46,063,209
වත්කම් අත්කර ගැනීම	13,750,000	6,115,923
පුනරුත්තාපනය හා ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම	48,250,000	20,051,723
මානව සම්පත් ව්‍යාපෘති	1,000,000	-
එකතුව	**108,000,000**	**72,230,855**

7.3 2020 වර්ෂයේ දී පුනරාවර්තන වියදම් (රු.)

විස්තරය	මුළු වියදම
පුද්ගල පඩිනඩි	312,018,590
ගමන් වියදම්	144,743
සැපයීම්	5,409,489
නඩත්තු වියදම්	2,436,852
ගිවිසුම්ගත සේවා	40,439,582
වෙනත් පුනරාවර්තන වියදම්	9,647,349
ශිෂ්‍යාධාර	7,652,430
එකතුව	**377,749,035**

7.4 පර්යේෂණ ව්‍යාපෘති උපයෝජනය සඳහා අරමුදල් විස්තර - 2020

නම සහ විස්තරය	අරමුදල් සපයන නියෝජිතායතනය	මුළු පිරිවැය (රු.)	වියදම (රු.)
ආර්.ඒස්.සී.ජී. රාජපක්ෂ මෙය කථිකාචාර්ය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	4,355,000	1,485,000
වෛද්‍ය ටී.ඒ.එන්.ආර්. ගුණරත්න මිය කථිකාචාර්ය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	3,029,000	-

08. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2020

විෂය	සූත්‍රය	එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම (රු.)
එක් ශිෂ්‍යයෙක් සඳහා පුනරාවර්තන වියදම (RE)	පුනරාවර්තන වියදම ÷ ශිෂ්‍ය සංඛ්‍යාව	713,095.58

09. 2020 වර්ෂයේ දී ලැබූ යටිතල පහසුකම් විස්තර

යටිතල පහසුකම් විස්තරය	වියදම් රු.
ඉදිකිරීම් ව්‍යාපෘති අධ්‍යයන ගොඩනැගිල්ල	46,063,209

10. නේවාසිකාගාර දත්ත - 2020

10.1 ස්ථිර කාන්තා නේවාසිකාගාර

නේවාසිකාගාරයේ නම	පිහිටීම	2020.12.31 දිනට
වික්‍රමාරච්චි කාන්තා නේවාසිකාගාරය	වීදියවත්ත, යක්කල	134

10.2 කුලියට ගත් නිවාස පහසුකම්

නේවාසිකාගාරයේ නම	පිහිටීම	2020.12.31 දිනට නේවාසික පහසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව			වසරකට කුලී පිරිවැය රු.
		පුරුෂ	කාන්තා	එකතුව	
ජයතිලක	පහළ වීදියවත්ත, යක්කල	-	12	12	480,000
සෙනෙවිරත්න	සමගි මාවත, යක්කල	30	-	30	924,000
රන්වැලි	රන්වැලි පෙදෙස, යක්කල	20	-	20	360,000
කෙසෙල්වතුගොඩ	චන්ද්‍රජෝති මාවත, යක්කල	34	-	34	720,000
මහවිට	මහවිට, යක්කල	17	-	17	540,000
පරාක්‍රම	රන්වැලි පෙදෙස, යක්කල	-	38	38	1,500,000
කරුණානායක	නුවර පාර, යක්කල	-	41	41	1,440,000
එකතුව		**101**	**91**	**192**	**5,964,000**

11. මහපොළ සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව දත්ත

ශිෂ්‍ය ලියාපදිංචි සංඛ්‍යාව	මහපොළ ලැබූ ශිෂ්‍යයින් සංඛ්‍යාව	ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍යයින් සංඛ්‍යාව
519	108	229

12. 2020 වර්ෂයේ පුස්තකාල දත්ත

12.1 2020 වර්ෂයේ ග්‍රන්ථ සම්පත් පිළිබඳ තොරතුරු

විස්තරය	මුදල (රු.)	පොත් සංඛ්‍යාව
පොත් මිල දී ගැනීම	383,690	443
පොත් පරිත්‍යාග ලබා ගැනීම	23,370	61
එකතුව	**407,060**	**504**

12.2 2020 වර්ෂයේ පුස්තකාල දඩ

වර්ෂය	මුදල (රු.)
2020.01.01 සිට 2020.12.31 දක්වා	**163,031**

12.3 2020.01.01 සිට 2020.12.31 දක්වා පුස්තකාල පරිශීලක දත්ත

සාමාජිකත්ව වර්ගය	තත්‍ය සාමාජික සංඛ්‍යාව	ලියාපංදිචි වූ සාමාජිකයින්
අදියර I - පළමු වසර (2017)	110	98
අදියර II - දෙවන වසර (2016)	106	73
අදියර III - තෙවන වසර (2015)	68	54
අදියර IV - සිව්වන වසර (2016)	66	20
අදියර V - පස්වන වසර (2016)	85	14
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	110	67
අධ්‍යයන කාර්ය මණ්ඩලය	36	29
අධ්‍යයන කාර්ය මණ්ඩලය (තාවකාලික)	20	16
එකතුව	**601**	**371**

13. මූල්‍ය ප්‍රකාශන

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - කැළණිය විශ්වවිද්‍යාලය

2020 දෙසැම්බර් 31වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)

විස්තරය	සටහන්	2020		2019	
		රු.	රු.	රු.	රු.
වත්කම්					
ජංගම වත්කම්					
මුදල් හා මුදල් සමාන දෑ	2	89,770,023		11,839,909	
විවිධ ණයකරුවෝ	3	1,696,430		304,430	
ණය හා අත්තිකාරම්	4	19,168,250		21,420,960	
බඩු ලේඛනය	5	2,372,060		1,472,380	
පූර්ව ගෙවීම්	6	1,422,010		864,616	
කෙටි කාලීන ආයෝජන		189,682,951		140,297,242	
වෙනත් ජංගම වත්කම්	7	2,206,983	**306,318,707**	2,549,806	**178,749,343**
ආයෝජන					
ස්ථාවර වත්කම්			114,853,093		109,899,653
ජංගම නොවන වත්කම්					
දේපළ පිරියත හා උපකරණ	8	552,533,037		437,543,390	
කෙරී ගෙන යන වැඩ	9	46,635,209		73,136,346	
ප්‍රාග්ධන අත්තිකාරම්		2,316,225		24,266,921	
අස්පර්ෂණීය වත්කම්	10	243,323		761,800	
වෙනත්		236,500	601,964,295	330,000	536,038,457
			716,817,388		**645,938,110**
මුළු වත්කම්			**1,023,136,095**		**824,687,453**
වගකීම්					
ජංගම වගකීම්					
සම්මුවිඡින වියදම්	11	5,605,470		10,598,127	
කළ යුතු ගෙවීම්	12	978,955		1,908,521	
ආපසු ගෙවිය යුතු තැන්පතු හා වෙනත්	13	41,480,562		52,733,222	
			48,064,987		**65,239,870**
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	14		132,403,243		145,801,140
මුළු වගකීම්			**180,468,230**		**211,041,010**
මුළු ශුද්ධ වත්කම්			**842,667,865**		**613,646,443**
ශුද්ධ වත්කම්/ සමකොටස්					
ප්‍රාග්ධනය (ගෙවූ)		416,337,418		376,365,443	
ප්‍රාග්ධනය (නොගෙවූ)		214,758,924		178,989,779	
පොදු සංචිත		(58,771,841)		(128,687,237)	
සීමා කළ අරමුදල් සහ ප්‍රදාන	15	48,954,236		19,642,014	
සංචිත ප්‍රත්‍යාගණනය හා ප්‍රදාන	16	221,389,128		167,336,444	
මුළු ශුද්ධ වත්කම්/ සම කොටස්			**842,667,865**		**613,646,443**

මෙම මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සහ වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානවල අවශ්‍යතාවන්ට අනුකූල වේ.

සී. ජී. කොතලාවල
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිත ඒ. ලියනගේ
නිසි බලධාරී

විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

ආර්. කේ. ඒ. රණවීර
මණ්ඩල සාමාජික

මහාචාර්ය පී. එම්. සී. තිලකරත්න
මණ්ඩල සාමාජික

2021 පෙබරවාරි මස 25 වැනි දින
යක්කල

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැළණිය විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31වැනි දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය
(*සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ*)

	සටහන්	2020		2019	
				රු.	රු.
ආදායම					
පුනරාවර්තන ප්‍රදාන			391,538,000		313,045,000
ප්‍රාග්ධන වත්කම් ක්‍රමක්ෂය			33,562,711		36,805,885
වෙනත් ආදායම්					
(1) ණය සහ අත්තිකාරම් පොලී		737,598		1,080,086	
(2) විවිධ ලැබීම්	17	1,131,586		627,058	
(3) ආයෝජන පොලිය		17,793,318		19,143,056	
(4) ලියාපදිංචි ගාස්තු		371,000		329,220	
(5) විභාග ගාස්තු		25,300		30,600	
(6) පුස්තකාල දඩ මුදල්		22,019		40,785	
(7) වෛද්‍ය ගාස්තු		2,000		24,250	
(8) දේපළ කුලිය	18	186,257		161,661	
(9) තොග විකුණුම		1,913		9,400	
(10) මහපොල හා ශිෂ්‍යාධාර	19	-		-	
(13) ස්වයං-මූල්‍ය වැඩසටහන්වලින් ආදායම		13,536,282	33,807,272	7,709,677	29,155,793
මුළු ආදායම			**458,907,983**		**379,006,678**
වියදම්					
(1) පුද්ගලික පඩිනඩි		312,018,590		345,168,133	
(2) ගමන් වියදම් සහ යැපීම් දීමනාව		144,743		314,872	
(3) සැපයුම් හා භාවිතා කළ පාරිභෝජන		5,409,489		6,765,838	
(4) නඩත්තුව		2,436,852		4,595,680	
(5) කොන්ත්‍රාත් සේවා		40,439,582		45,143,310	
(6) පර්යේෂණ හා සංවර්ධනය		-		6,500	
(7) ක්ෂයවීම්		33,562,711		36,805,885	
(8) වෙනත් මෙහෙයුම් වියදම්		9,647,349		11,808,898	
(9) ස්වයං-මූල්‍ය වැඩසටහන් සඳහා වියදම්		8,390,551		6,333,636	
(10) උත්පාදිත අරමුදල් වියදම්		1,507,699		2,604,001	
මුළු වියදම්			**413,557,566**		**459,546,753**
වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාව)			**45,350,417**		**(80,540,075)**

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැළණිය විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා
වත්කම්/ සම කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

විෂය කේතය	ගෙවූ ප්‍රාග්ධනය රු.	නොගෙවූ ප්‍රාග්ධනය රු.	ප්‍රත්‍යාගණන සංචිතය රු.	පොදු සංචිතය රු.	සංචිත හා සීමා කළ අරමුදල් රු.	එකතුව රු.
2018 දෙසැම්බර් 31වැනි දිනට ශේෂය	**367,379,924**	**176,530,257**	**154,864,062**	**(46,742,422)**	**19,045,700**	**671,077,521**
වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)	8,985,519	2,459,522	12,472,381	(80,540,075)	596,314	(56,026,339)
මාරු කිරීම්/ ශුද්ධ වලනයන්						
පොදු සංචිත ගිණුමට සිදු කළ ගැලපීම් - 2019				(1,404,740)		(1,404,740)
2019 දෙසැම්බර් 31දිනට ශේෂය	**376,365,443**	**178,989,779**	**167,336,443**	**(128,687,237)**	**19,642,014**	**613,646,442**
වසර සඳහා අතිරික්තය/ (හිඟය)	39,971,975	35,769,145	54,052,685	45,350,417	29,312,222	204,456,444
මාරු කිරීම්/ ශුද්ධ වලනයන්	-					
පොදු සංචිත ගිණුමට සිදු කළ ගැලපීම් - 2020				33,231,682		33,231,682
				(8,666,703)		**(8,666,703)**
2020 දෙසැම්බර් 31දිනට ශේෂය	**416,337,418**	**214,758,924**	**221,389,128**	**(58,771,841)**	**48,954,236**	**842,667,865**

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැළණිය විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

	2020 රු. 000’	2019 රු. 000’
මෙහෙයුම් ක්‍රියාවලිවලින් මූල්‍ය ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය (හිඟය)	45,350	(80,540)
එකතු කළා: මූල්‍ය නොවන කටයුතු		
ක්ෂයවීම්	33,563	36,806
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන - පාරිතෝෂකය	9,578	77,671
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(33,563)	(36,806)
අස්පර්ශනීය වත්කම් ක්‍රමක්ෂය	612	(532)
වැඩ ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ	**55,540**	**(3,401)**
සිදු කළ ගෙවීම්වල වැඩිවීම/ (අඩුවීම)	(55,638)	27,330
බඩු ලේඛනවල (වැඩිවීම)/අඩු කිරීම	(900)	(68)
ගනුදෙනු හා වෙනත් ලැබීම්වල අඩුවීම (වැඩිවීම)/අඩු කිරීම	646	48
ගනුදෙනු හා වෙනත් ගෙවීම්වල වැඩිවීම (වැඩිවීම/ (අඩුවීම)	8,249	(5,200)
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල	**6,480**	**18,709**
පාරිතෝෂික ගෙවීම්	(3,820)	(3,659)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**2,660**	**15,050**
ආයෝජන කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය		
පිරියත හා උපකරණ මිල දී ගැනීම	(27,453)	(37,008)
කෙරී ගෙන යන වැඩ	26,501	(6,500)
වෙනත් හා ප්‍රාග්ධන අත්තිකාරම්	21,951	7,967
ශුද්ධ ආයෝජනය	(54,528)	(22,015)
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(33,529)**	**(57,555)**
මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය		
පෙර වර්ෂයේ ගැලපීම් (ශුද්ධ)	-	(1,405)
ලැබූ ප්‍රදාන	108,000	46,500
සීමා කළ අරමුදල්	605	(1,256)
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**108,605**	**43,839**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	77,931	1,333
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ	11,840	10,506
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ	**89,770**	**11,838**

<u>ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය</u>
<u>කැළණිය විශ්වවිද්‍යාලය</u>
<u>වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්</u>

1. ආයතනික තොරතුරු

1. 1 පදිංචිය හා නෛතික ස්වභාවය

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ නිකුත් කළ 1995 පෙබරවාරි මස 23වැනි දිනැති අංක 859/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව 1995 මාර්තු මස 01වැනි දින සිට කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යායතනයක් ලෙස පිළිගනු ලැබේ. විද්‍යායතනය ශ්‍රී ලංකාවේ, යක්කල පිහිටා ඇත. තව ද ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව “ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය” නමින් සම්පූර්ණ පහසුකම් සහිත විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීමට නියමිත වේ.

1.2 විද්‍යායතනයේ බලතල, කර්තව්‍යය සහ ක්‍රියාකාරකම්

1995 මාර්තු මස 13 දිනැති අංක 862/8 දරන අති විශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන ආඥා පනතට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තෝරා ගත් ශිෂ්‍යයින් විද්‍යායතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව මඟින් අනුමත කරනු ලබන පරිදි ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ශාඛා සම්බන්ධයෙන් උපදෙස් දීම සහ පුහුණුව ලබා දීම පිණිස බඳවා ගැනීම සහ ශික්ෂණය, පුහුණුව සහ පර්යේෂණ කාර්යය සඳහා ගුරුවරුන්, විද්‍යාර්තයින්, ශිෂ්‍යයින් හුවමාරු කර ගැනීම හෝ වෙනත් ආකාරයකින් ශ්‍රී ලංකාවේ හෝ විදේශීය විශ්වවිද්‍යාල හෝ විද්‍යායතන සමඟ සබඳතා ඇති කර ගැනීම විද්‍යායතනයේ බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට ඇතුළත් වේ.

1.3 කළමනාකරණ/ භාරකාර මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරනු ලැබේ.

1.4 නිකුත් කිරීම සඳහා බලයදීමේ දිනය

කළමනාකරණ මණ්ඩලය 2020 පෙබරවාරි මස 24 වැනි දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය දී ඇත.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සකස් කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශනවලට 2020 වර්ෂයේ දෙසැම්බර් 31වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය කාර්යසාධනය, මුදල් ප්‍රවාහය, ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, ගිණුම්කරන ප්‍රතිපත්ති සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (<u>අදාළ වන පරිදි SLPSAS I වැනි වෙළුම, II වැනි වෙළුම සහ III වැනි වෙළුම</u>) අනුකූලව සකස් කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනම මත සකස් කර ඇත.

2.1.1 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථා හැරුණු කොට අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කර ඇත. වත්කම් හා වගකීම්වල සාපේක්ෂ ද්‍රවශීලීත්වය නිරූපණය කරන පරිදි ඒවා කාණ්ඩ කර ඇත.

2.1.2 තුලනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම වැඩිදියුණු කිරීම පිණිස සහ කාලපරිච්ඡේද අතර තුලනාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම අගයන් සඳහා කලින් කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළත් තුලනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කර ඇති විට වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සැලසීම පිණිස ප්‍රවර්තන වර්ෂයට අනුකූලවීම සඳහා තුලනාත්මක අගයන් නැවත වර්ගීකරණය කර ඇත.

2.1.3 අඛණ්ඩ ක්‍රියාකාරීත්වය

පූර්වේක්ෂණය කළ හැකි අනාගතය සඳහා විද්‍යායතනය අඛණ්ඩ ක්‍රියාකාරීත්වයකින් පවතින උපකල්පනය මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය අඛණ්ඩව පැවතීම සඳහා සිය හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර පූර්වේක්ෂණය කළ හැකි අනාගතයක් සඳහා සිය කටයුතු පවත්වා ගෙන යාම පිණිස සම්පත් පවතින බවට සෑහීමකට පත් වී ඇත. තව ද, විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සැලකිය යුතු අවිනිශ්චිතතාවන් සම්බන්ධයෙන් විද්‍යායතනයේ කළමනාකරණ මන්ඩලය නොදනී.

2.1.4 ගනුදෙනු කරන ව්‍යවහාර මුදල

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන එහි කෘත්‍ය හා වාර්තාකරණ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට වටයා ඉදිරිපත් කර ඇත.

2.1.5 ඇස්තමේන්තු සහ තීණ්දු භාවිතා කිරීම

අදාළ පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකාරීත්වය මඟින් ප්‍රතිපත්ති යොදා ගැනීමට සහ වත්කම් හා වගකීම්වලට, ආදායම හා වියදමට වාර්තා කළ අගයන්ට බලපාන තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන ඇති කර ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පන ඓතිහාසික අත්දැකීම් හා පවතින තත්ත්වයන් යටතේ යුක්තිසහගත බවට විශ්වාස කරන විවිධ වෙනත් සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ උපකල්පන කෙරී ගෙන යන පදනම මත සමාලෝචනය කරනු ලැබේ.

2.2. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සාරාංශය

2.2.1 දේපළ, පිරියත හා උපකරණ

(අ) හඳුනා ගැනීම සහ මිනුම

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමට කිසියම් සමුච්චිත ක්ෂයවීම සඳහා අඩු කිරීම් සිදු කිරීමෙන් පසුව දරන ලද පිරිවැයට හෝ සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ සියලුම අයිතම මුල් අවස්ථාවේ දී පිරිවැයට වාර්තා කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතම පසුව ප්‍රත්‍යාගහනය කරන විට එවැනි වත්කම්වල සියලුම පන්ති සාදාරණ වටිනාකමට ප්‍රත්‍යාගහනය කරනු ලැබේ. ප්‍රමාණාත්මක විධිමත්භාවයක් ඇතිව ප්‍රත්‍යාගහනය සිදු වේ. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ කලින් හඳුනා ගත් එම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ආපසු හැරවීමක් නොවන තාක් දුරට හැරුණු කොට වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි රැගෙන යන අගයේ කිසියම් වැඩිවීමක් ඍජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර එවැනි අවස්ථාවක දී වැඩිවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

එකම වත්කමක පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම ප්‍රත්‍යාගණන හිඟයක් ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තය සම්බන්ධයෙන් සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල වියදමක් ලෙස හඳුනා ගෙන ඇති ඕනෑම වියදමක් සම්බන්ධයෙන් ඍජුව හිලව් කරනු ලැබේ.

විකිණූ වත්කම ආශ්‍රිත ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් සමුච්චිත අතිරික්තයට හෝ හිඟයට මාරු කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කළ විට, බැහැර කළ විට හෝ එහි භාවිතාවෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගනු ලබන්නේ නැත; වත්කම හඳුනා නොගැනීමෙන් මතුවන කිසියම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම හඳුනා නොගන්නා වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

(ආ) ක්ෂයවීම

සින්නක්කර ඉඩම් හැරුණු කොට, වත්කම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය මත එම වත්කම්වල පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත සඳහන් ප්‍රමාණවලින් සරල රේඛීය පදනම මත මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනයට ක්ෂයවීම් ඇතුළත් කොට ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ:

විස්තරය	**වර්ෂ**
ගොඩනැගිලි	20
ගෘහභාණ්ඩ හා තිරවුරු	10
උපකරණ	10
කාර්යාල උපකරණ	05
මෝටර් වාහන	05
පුස්තකාල පොත් සහ වාරසඟරා	05
විද්‍යාගාර, ශික්ෂණ උපකරණ	05

වත්කමක් භාවිතය සඳහා ලබා ගැනීමට ඇති විට ක්ෂයවීම ආරම්භ වන අතර එය බැහැර කළ විට හෝ ස්ථීර වශයෙන්ම ආපසු ගත් විට අවසාන වේ.

(ඇ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම මුදල් බවට හරවනු ලබන්නේ වියදම් මඟින් විද්‍යායතනයට එකතු වන කිසියම් අදාළ වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභය හෝ සේවා විභවය වැඩි කරන්නේ නම් පමණි. එදිනෙදා සේවා සැපයීම සඳහා වූ පිරිවැය මූලික වශයෙන් ශ්‍රමය හා පරිභෝජන භාණ්ඩ සඳහා වැය වන පිරිවැය වන අතර සුළු කොටස්වල පිරිවැය ඇතුළත් විය හැකිය. මෙම වියදම්වල අරමුණ බොහෝවිට දේපළ, පිරියත හා උපකරණ "අළුත්වැඩියාව සහ නඩත්තුව" ලෙස විස්තර කරනු ලබන අතර මෙම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනී.

(ඈ) කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයට ප්‍රකාශ කරනු ලැබේ. මුදල් බවට හැරවීමට අපේක්ෂාවෙන් ඇති ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලි නවෝත්පාදන වැඩ, විශාල පිරියත හා යන්ත්‍රෝපකරණ හා පද්ධති ගොඩනැගීම මත දැරූ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

(2012 දී අවසන් කරන ලද) පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ අවසාන බිල්පත මේ වන විටත් ආයතනයට ලැබී නොමැත. ඉහත ව්‍යාපෘතිය සඳහා එම දිනය වන තෙක් දැරූ ඉදිකිරීම් පිරිවැය කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත වසර තුළ දී ප්‍රාග්ධන මුදල් බවට පත් කරන ලද අතර ඒ අනුව ක්‍රමක්ෂය කරන ලදී.

ශිෂ්‍ය මධ්‍යස්ථානය **II** වැනි අදියර සම්බන්ධයෙන් ගෙවන ලද ප්‍රාග්ධන අත්තිකාරම වසර තුළ දී මුදල් බවට පත් කරන ලද අතර ඒ අනුව ක්‍රමක්ෂය කරන ලදී.

2.2.2 අස්පර්ෂණීය වත්කම්

විද්‍යායතනයේ අස්පර්ශණීය වත්කම්වලට පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් වේ. අදාළ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ එයට ආවේණික අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ විද්‍යායතනයට ගලා එන්නේ නම් පමණක් අස්පර්ෂණීය වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර අස්පර්ෂණීය වත්කම් ඇස්තමේන්තුගත ජීවිත කාලය පුරාවට ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.2.3 ආයෝජන

ස්ථාවර තැන්පතුවල ආයෝජන ගනුදෙනු මිලට හඳුනා ගනු ලබන අතර ලැබූ පොළිය සමඟ පිරිවැයට අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ නිරූපණය කරනු ලැබේ. සියලුම ස්ථාවර තැන්පතු රාජ්‍ය බැංකුවල සිදු කර තිබේ.

ලැබූ පොළිය හෝ වසර සඳහා වූ ආයෝජනවලින් ලැබෙන පොළිය වසර ඇතුළත එවැනි ආයෝජන සඳහා බැංකුවෙන් ප්‍රකාශිත අනුපාතය මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

2.2.4 භාණ්ඩ ලේඛන (ගබඩා අත්තිකාරම්)

භාණ්ඩ ලේඛන අඩුම පිරිවැය හෝ ශුද්ධ හඳුනාගත හැකි අඩුම වටිනාකම මත වටිනාකම් දක්වනු ලැබේ.

භාණ්ඩ ලේඛණවල එක් එක් කාණ්ඩයේ පිරිවැය FIFO ක්‍රමය මඟින් තීරණය කරනු ලැබේ.

2.2.5 මුදල් හා මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වේ.

වක්‍ර ක්‍රමය යටතේ සකස් කරනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වන අතර ඉහත විස්තර කළ පරිදි කෙටි කාලීන තැන්පතු විද්‍යායතනයේ මූල්‍ය කළමනාකරණයේ අන්තර්ගත කොටසක් ලෙස සලකනු ලැබේ.

2.2.6 විවිධ ණයකරුවෝ

"ණය" යන්නෙන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් හැඳින්වේ. මෙම ණය නිකුත් කරනු ලබන්නේ ඇපයක් මතය. තව ද ණය ශේෂයන් සේවකයාගේ මාසික වැටුපෙන් අය කරනු ලැබේ. සේවකයා සේවය අතහැර යන අවස්ථාවක දී එවැනි මුදල් අගයන් සේවකයාගේ අර්ථසාධක අරමුදල් ශේෂයෙන් සම්පූර්ණයෙන්ම ආපසු අය කර ගනු ලැබේ. එබැවින් බොල් ණය ආපසු අය කර ගැනීම සඳහා විධිවිධාන නොමැත.

2.2.7 කෙටි කාලීන ආයෝජන

මාස තුනක හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන තැන්පතු නියෝජනය කරන සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් වැදගත් නොවන අවදානමකට භාජනය වන කෙටි කාලීන ආයෝජන ලැබෙන පොළිය සහ පිරිවැය මත සලකා බලනු ලැබේ.

2.2.8 පොදු සංචිතය

පොදු සංචිතයට වර්ෂය තුළ එකතු වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ අතිරික්තයන් සහ හිඟ ඇතුළත් වේ. පසුගිය වසරට අදාළ රු. 104,122, 258/-ක මුදලක් වර්ෂය තුළ දී පොදු සංචිතයට හර කර ඇත.

2.2.9 සීමා කළ අරමුදල් සහ ප්‍රදාන

සීමා කළ අරමුදල් සහ ප්‍රදාන පර්යේෂණ ප්‍රදාන සහ විශේෂිත කාර්යයන් සඳහා වෙන් කර ඇති ලැබූ වෙනත් ප්‍රදාන නිරූපණය කරයි.

2.2.10 සේවක ප්‍රතිලාභ

(i) නිර්මිත ප්‍රතිලාභ සැලසුම්

විද්‍යායතනය මඟින් සුදුසුකම් ඇති සියලු සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ දක්වා ඇති පරිදි ප්‍රතිපාදන සැලැස්මක් අනුගමනය කරනු ලැබේ. අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම සිදු කර ඇත.

කෙසේවුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ වගකීම් පැන නඟින්නේ අවම වශයෙන් වසර පහක අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා පමණක් වන අතර වගකීම් සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම-නොවන වගකීම් යටතේ කාණ්ඩගත කර ඇත.

අරමුදල් නොමැති තත්ත්වය හේතුවෙන් පාරිතෝෂික විධිවිධාන පූර්ණවශයෙන් බාහිරව ආයෝජනය කර නොමැති බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (SLPAS 19) අනුව අදාළ වන පරිදි ඉහත නිර්මිත ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් විධිවිධාන හඳුනා ගැනීම පළමු වරට යොදා ගැනීම 2019 ජනවාරි මස 01වැනි දින සිට සිදු කරනු ඇත.

(ii) නිර්මිත දායකත්ව සැලසුම්

විද්‍යායතනයේ සියලුම සේවකයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වෙති. විද්‍යායතනය මූලික වැටුපෙන් සහ දීමනාවලින් 15%ක් එම අරමුදලට දායකත්වය දක්වයි. තව ද 1999 සැප්තැම්බර් මස 01වැනි දින හෝ ඊට පසු බඳවා ගත් සේවකයින් මෙම දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලයේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සිදු කරන 15%ක දායකත්වයෙන් 8%ක් මාසිකව දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කරනු ලැබේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

විද්‍යායතනය සෑම සේවකයෙක්ගේම වැටුප් සහ දීමනාවලින් 3%ක් සේවක භාර අරමුදලට දායක කරනු ලබන අතර මෙම අරමුදල නිර්මිත දායකත්ව සැලැස්ම යටතේ වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිර්මිත දායකත්ව සැලැසුම් වෙත සිදු කරන දායකත්වය සඳහා වූ බැඳීම් ඒවා මතු වන විට සහ මතු වන අවස්ථාවල දී මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස වට්ටම් නොකළ පදනම මත හඳුනා ගනු ලැබේ.

2.2.10 ආදායම හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ විද්‍යායතනයට ගලා එන ප්‍රමාණයට සහ එය විශ්වාසදායක අන්දමින් මැනිය හැකි තාක් දුරට ආදායම හඳුනා ගනී.

ශිෂ්‍යයින්ගෙන් ලැබූ බඳවා ගැනීමේ ගාස්තු, වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු සහ වෛද්‍ය ගාස්තු ලියාපදිංචිය නිමා කරන අවස්ථාවේ ආදායම සහ ලැබීමේ පදනම මත ආදායම ලෙස හඳුනා ගනී.

විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු පැවැත්වීම සඳහා වූ ගාස්තු එවැනි කටයුතු අවසන් කළ විට ආදායම ලෙස හඳුනා ගනී.

ස්වයං-මූල්‍ය වැඩසටහන් සඳහා ගාස්තු වර්ෂය අවසානයේ දී එවැනි පාඨමාලා නිමා කළ අදියර මත පදනම්ව ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනාගත කාලපරිච්ඡේදවලට සම්බන්ධ දේශන ගාස්තු සහ ගෙවීම් ප්‍රවර්තන වගකීම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. පොළී ආදායම සහ කුළී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී.

ශ්‍රී ලංකා ආණ්ඩුවේ මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදාන අදාළ පිරිවැය හඳුනා ගත් කාලපරිච්ඡේදය තුළ ආදායම ලෙස හඳුනා ගනී.

පසු කාලීන කාලපරිච්ඡේදවල දී වියදම් කරන වත්කම් අත්කර ගැනීමට උපයෝජනය කළ රජයේ ප්‍රදාන විලම්භිත ආදායම (වියදම් නොකළ ප්‍රාග්ධනය) ලෙස හඳුනා ගනී. මුදල් හා මුදල් සමාන දෑ, අඩු වගකීම් (ලැබූ ප්‍රදාන සම්බන්ධ වගකීම් හැරුණු කොට) ඇතුළු වෙනත් වත්කම්වලින් නිරූපණය කරන රජයේ ප්‍රදාන වගකීම් ලෙස හඳුනා ගනී. විලම්භිත ආදායම ලෙස හඳුනා ගන්නා රජයේ ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් කාලය අවසානයේ දී ක්‍රමක්ෂය කර ඇත.

2.2.11 වියදම හඳුනා ගැනීම

වියදම්, දැරූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමවල ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාව මත පදනම්ව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල හඳුනා ගනු ලැබේ. ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේ දී සහ දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙනයාමේ දී දැරූ සියලුම වියදම් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා විද්‍යායතනයේ කාර්යසාධනයේ ලක්ෂණ සාධාරණය ඉදිරිපත් කිරීමේ පදනම මත "වියදම් කටයුතු" ක්‍රමය යොදා ගෙන ඇත.

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත වගකීම් සලකා බලන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල වෙනස්කම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

2.2.14 වාර්තාකරණ දිනට පසුව සිදුවීම්

වාර්තාකරන දිනට පසු එන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලදුව අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශන සටහන්වලට නිසි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව " ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් සම්පූර්ණ පහසුකම් සහිත විශ්වවිද්‍යාලයක මට්ටමට උසස් කිරීමට නියමිත වේ.

2.2.15 ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම්

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත බැරකම් සැලකිල්ලට ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

2018 වසරේ අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ඇපයක් ලෙස රඳවා ගත් කාර්යසාධන බැඳුම්කරය සහ අත්තිකාරම් බැඳුම්කරය මුදල් බවට හරවා ගැනීමට එරෙහිව කොන්ත්‍රාත්කරුවෙක් විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කර ඇති නඩු කටයුත්තක් (රිට් අයදුම්පත්‍රයක්) විභාග වෙමින් ඇත. කෙසේවුව ද, බේරුම්කරුවෙක් පත් කිරීමේ අදහස ඇතිව 2019 වසරේ දී කොන්ත්‍රාත්කරු විසින් මෙම නඩු කටයුත්ත ඉල්ලා අස් කර ගන්නා ලද අතර 2020 වසරේ දී පාර්ශ්වකරුවන් විසින් අන්‍යෝන්‍ය එකඟතාව ඇතිව විසඳීමට එකඟ වී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ පැවති සියලුම බිල්පත් වසර තුළ දී නිරවුල් කරන ලද අතර මෙය යටතේ අනාගතයේ දී කිසිදු අවිනිශ්චිත අවස්ථා වගකීමක් පැන නොනඟිනු ඇත.

එකී කොන්ත්‍රාත්තුවේ කාර්යසාධන බැඳුම්කරය සහ අත්තිකාරම් බැඳුම්කරය වසර තුළ දී වසා තබන ලදී. බේරුම්කරණ ක්‍රියාවලිය මේ වන තෙක් නිමා කර නොමැති අතර බැඳීම නිරවුල් කිරීම සඳහා අවශ්‍ය සම්පත් බැහැරින් ගලා ඒමක් නොමැති බැවින් ප්‍රතිපාදන දක්වා නොමැත.

(2012 වර්ෂයේ දී නිමා කළ) පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ අවසාන බිල්පත මේ වන තෙත් විද්‍යායතනයට ලැබී නොමැත. ඉහත ව්‍යාපෘතිය සඳහා එකී දිනය දක්වා දැරූ ඉදිකිරීම් පිරිවැය සුදුසු පරිදි ගණනය කර ක්ෂය කර ඇත.

2.2.16 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් ගන්නා කිසියම් තීරණයකට යුක්තිසහගතව බලපෑම් කළ හැකි කිසිදු වැදගත් ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනුවක් වර්ෂය තුළ දී සිදු වී නොමැත.

2.2.17 බදු අය කිරීම්

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 (ආ) වගන්තිය අනුව විද්‍යායතනය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	2020	2019
සටහන - 02	රු.	රු.
මුදල් හා මුදල් සමාන දෑ		
බැංකු ශේෂය		
ගිණුම් අංක 333-1001-1-0000059	63,697,808	1,171,139
ගිණුම් අංක 333-1002-0-0000059	26,072,216	10,668,770
එකතුව	**89,770,023**	**11,839,909**
සටහන - 03		
විවිධ ණයගැතියෝ		
ශිෂ්‍යාධාර	1,696,430	304.430
එකතුව	**1,696,430**	**304.430**
සටහන - 04		
රජයට දෙන ණය හා අත්තිකාරම්		
ආපදා ණය	17,446,685	19,420,321
කාර්ය මණ්ඩල ණය	118,490	126,820
වාහන ණය	610,000	1,117,585
පරිගණක ණය	903,089	621,700
විදේශ ආපදා ණය (මාස දෙකක්)	89,987	82,034
උත්සව අත්තිකාරම්	-	52,500
එකතුව	**19,168,250**	**21,420,960**
සටහන - 05		
ගබඩා අත්තිකාරම්		
ගබඩා අත්තිකාරම් ගිණුම (හාණ්ඩ ලැයිස්තුව)	2,372,060	1,472,380
එකතුව	**2,372,060**	**1,472,380**
සටහන - 06		
පූර්ව-ගෙවීම්		
වසර අවසානයේ දී	1,422,010	864,616
එකතුව	**1,422,010**	**864,616**
සටහන - 07		
වෙනත්		
තැන්පතු - ඉන්ධන	138,500	138,500
ආහාර	3,000	3,000
විදුලිය	511,395	511,395
ගෑස් සිලින්ඩර	43,768	43,768
ජලය	276,000	276,000
ඩයලොග් රූපවාහිනිය	18,000	18,000
සේවකයින් සඳහා වූ ඩයලොග් පැකේජය	49,335	2,415
ලැබිය යුතු ආපනශාලා ගාස්තු	500	500
ආයෝජනවලින් ලැබිය යුතු පොලිය	1,166,485	1,526,795
ශල්‍යතන්ත්‍රය පිළිබඳ IIIවැනි ඩිප්ලෝවෙන් ලැබිය යුතු *	-	6,716
2018/2019 කායවිකිත්සාව පිළිබඳ IIIවැනි ඩිප්ලෝවෙන් ලැබිය යුතු	-	20,501
2018/2019 විද්‍යාපති උපාධියෙන් ලැබිය යුතු	-	2,216
එකතුව	**2,206,983**	**2,549,806**

සටහන - 08 - දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය/ ගණනය කිරීම

සින්නක්කර වත්කම්

විස්තරය	ඉඩම	ගොඩනැගිලි	කාර්යාල උපකරණ	විද්‍යාගාර හා තාක්ෂණ උපකරණ	ගෘහභාණ්ඩ හා තිරවුරු	පුස්තකාල පොත් හා වාරසඟරා	මෝටර් රථ	පිරියත හා යන්ත්‍රසූත්‍ර	එකතුව
2020.01.01 දිනට ශේෂය	72,126,250	412,276,685	56,946,258	54,688,780	34,199,908	15,418,395	24,264,600	22,178,683	692,099,559 ,-
එකතුව* 1		66,953,067	2,122,107	1,217,339	1,392,559	383,641	857,617	1,427,660	74,353,990
ප්‍රදාන* 2			26,884,071			23,370	1,800,000		28,707,441
WIPවලින් මාරු කිරීම්									-
ගැලපීම්		(922,000)							(922,000)
ප්‍රත්‍යාගණන* 3	(72,126,250)	(343,446,453)							(415,572,703)
	236,000,000	131,945,000							367,945,000
2020.12.31 දිනට ශේෂය	**236,000,000**	**266,806,300**	**85,952,436**	**55,906,119**	**35,592,467**	**15,825,406**	**26,922,217**	**23,606,343**	**746,611,288**

සමුච්චිත ක්ෂයවීම්

විස්තරය	ඉඩම්	ගොඩනැගිලි	කාර්යාල උපකරණ	විද්‍යාගාර හා තාක්ෂණ උපකරණ	ගෘහභාණ්ඩ හා තිරවුරු	පුස්තකාල පොත් හා වාරසඟරා	මෝටර් රථ	පිරියත හා යන්ත්‍රසූත්‍ර	එකතුව
2020.01.01 දිනට ශේෂය	-	111,231,959	38,381,668	48,875,899	23,537,057	15,314,850	4,686,466	12,528,272	254,556,170
වර්ෂය සඳහා අය කළ	-	12,864,530	7,410,683	3,703,514	2,154,039	457,004	4,890,442	2,082,498	33,562,711
ගැලපීම්		(12,687)			(3,825)			282	(16,229)
ප්‍රත්‍යාගණනය සඳහා ඉවත් කිරීම - එකතු කිරීම* 4		8,645,986							8,645,986
ප්‍රත්‍යාගණනය සඳහා ඉවත් කිරීම - අඩු කිරීම		(102,670,386)							(102,670,386)
2020.12.31 දිනට ශේෂය	-	30,059,402	45,792,351	52,579,413	25,687,271	15,771,853	9,576,908	14,611,052	194,078,251
2019.12.31 දිනට ශේෂය ධාරක ශේෂය	72,126,250	301,044,726	18,564,590	5,812,881	10,662,851	103,545	19,578,134	9,650,412	437,543,390
2020.12.31 දිනට ශේෂය ධාරක ශේෂය	**236,000,000**	**236,746,898**	**40,160,085**	**3,326,706**	**9,905,196**	**53,553**	**17,345,309**	**8,995,292**	**552,533,037**

සටහන්

1. ශිෂ්‍ය මධ්‍යස්ථානය IIවැනි අදියර මඟින් ඉදිරියට ගෙන ගිය රු. 46,901,344ක් වූ වටිනාකම සහ පුස්තකාල ගොඩනැගිල්ල සඳහා ගෙවූ රු. 4,513,788ක් වූ අත්තිකාරම වර්ෂය තුළ දී මුදල් බවට පත් කළ අතර ඒ අනුව ක්ෂයවීම්වලට ගලපන ලදී
2. ආයතනයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතලපහසුකම් හා ආරක්ෂිත වයිෆයි ජාල සම්බන්ධතා සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් රු. 26,884,071ක ප්‍රදානයක් හිමිවිය. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුනු රු. 1,800,000ක් වටිනා මෝටර් රථය සහ ප්‍රදාන ලෙස පුස්තකාලයට ලැබුනු පොත් වර්ෂය තුළ දී ගිණුම්ගත කරන ලදී.
3. (නව පරිපාලන ගොඩනැගිල්ල, අත්කර ගැනීමේ ක්‍රියාවලිය යටතේ ඇති ඉවම් සහ 2020 සැප්තැම්බර් මස අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුනු එක් මෝටර් රථය තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ප්‍රත්‍යාගණනය කළ අතර වර්ෂය තුළ දී අවශ්‍ය ගැලපීම් සිදු කරන ලදී. 2020 මූල්‍ය වර්ෂය අවසානයේ දී සම්පූර්ණයෙන්ම ක්ෂය කළ වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා තක්සේරු කම්ටු පත් කළ අතර ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සිදු කරමින් ඇත. 2021.03.01 සිට ආයතනය විශ්වවිද්‍යාල මට්ටමට උසස් කිරීමට නියමිත වන අතර 2021 වර්ෂයේ සිට 2021.03.01 දිනට ඇති නව වටිනාකම් හඳුනා ගැනීමට නියමිත වේ. එමෙන්ම ආයතනයේ මෙම පරිවර්තන කාලය තුළ දී වත්කම් බැහැර කිරීම නිමා කර නොමැත.

	2020	2019
	රු.	රු.
සටහන - 09		
කෙරී ගෙන යන වැඩ		
ශිෂ්‍ය කේන්ද්‍රීය ගොඩනැගිල්ල	-	46,901,344
අධ්‍යයන ගොඩනැගිල්ල	46,063,209	25,663,002
කාන්තා නේවාසිකාගාරය	572,000	572,000
එකතුව	**46,635,209**	**73,136,346**
සටහන -10		
අස්පර්ෂණීය වත්කම්		
ආරම්භයේ දී ශේෂය	761,800	559,800
වසර තුළ දී එකතු කිරීම්	-	202,000
	(518,477)	
එකතුව	**243,323**	**761,800**
සටහන -11		
සමුච්ඡිත වියදම්		
විදුලි බලය	315,000	995,874
ජලය	321,000	175,000
දුරකථන	1,084,000	76,340
වෙනත් පුනරාවර්තන	45,800	88,000
බාහිර කථිකාචාර්ය ගාස්තු	-	445,000
ඉන්ධන	146,000	159,198
ගමන්	9,000	18,000
අතිකාල	168,000	121,000
විභාග ගාස්තු	750,000	850,000
නඩත්තු වියදම් - වාහන	150,000	300,000
සුරැකුම්පත්	1,215,920	2,776,464
පුවත්පත්	170,000	100,000
නිවාඩු ගමන් බලපත්‍ර හා වාර ප්‍රවේශපත්‍ර	-	159,700
පිරිසිදු කිරීමේ සේවා	702,250	677,134
අනුපාත සහ බදු	3,000	380,460
වැටුප්	300,000	3,052,345
වෙනත් සේවා	213,000	6,950
මුද්‍රණ ගාස්තු	-	23,500
වෙනත් සැපයුම්	-	12,150
ප්‍රවාහනය	7,000	-
විශේෂ සේවාවන්	4,500	172,012
වාර ප්‍රවේශපත්‍ර	-	9,000
එකතුව	**5,604,470**	**10,598,127**
සටහන -12		
කළ යුතු ගෙවීම්		
විවිධ ණයකරුවෝ	978,955	1,908,521
එකතුව	**978,955**	**1,908,521**

සටහන -13	රු.	රු.
ආපසු ගෙවිය යුතු තැන්පතු සහ වෙනත්	**2020**	**2019**
ආපසු ගෙවිය යුතු තැන්පතු	5,000	5,000
විවිධ තැන්පතු	918,411	21,349,410
නොගෙවූ වවුවර	65,220	38,720
වෙනත්		
රඳවා ගැනීම්	10,157,693	11,611,592
යෝග VI ඩිප්ලෝමාව	738,833	738,833
යෝග VII ඩිප්ලෝමාව	867,417	-
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXIII	-	53
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXIV	-	63
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXV	-	53
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXVI	-	67
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXVII	23,000	23,000
විද්‍යාපති 2013/2014	358,036	462,036
විද්‍යාපති 11 කොටස 2013/2014	461,052	461,053
විද්‍යාපති පංචකර්ම 2013/2014	1,713,386	1,758,386
විද්‍යාපති කායවිකිත්සාව 2013/2014	1,049,179	1,049,179
පංචකර්ම ඩිප්ලෝමාව - 2015	2,997,313	3,150,163
ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමාව -11	475,319	475,319
පංචකර්ම ඩිප්ලෝමාව - 2016/2017	2,392,424	2,462,374
කායවිකිත්සාව ඩිප්ලෝමාව - 2016/2017	2,420,634	2,416,634
කායවිකිත්සාව ඩිප්ලෝමාව - 2015	1,093,896	1,147,896
ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාව - 2016/2017	1,749,214	1,859,214
ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාව - 03	1,022,118	-
යෝග සහතිකපත්‍ර පාඨමාලාව -28	18,055	-
යෝග සහතිකපත්‍ර පාඨමාලාව -29	26,000	-
යෝග සහතිකපත්‍ර පාඨමාලාව - 30	44,000	-
කායවිකිත්සාව ඩිප්ලෝමාව - 2017/2018	895,447	967,447
කායවිකිත්සාව ඩිප්ලෝමාව - 2018/2019	1,170,750	-
පංචකර්මය ඩිප්ලෝමාව - 2017/2018	1,160,148	1,179,148
පංචකර්මය ඩිප්ලෝමාව - 2018/2019	1,572,725	1,954
එම්. ඒ. ඒ. අයි. පිළිබඳ ඩිප්ලෝමාව - 2018/2019	7,032,156	59,864
විද්‍යාපති කායවිකිත්සාව 2017/2018	3,655	3,655
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම	1,049,356	1,083,146
උපයන විට ගෙවීමේ බද්ද	-	416,088
මුද්දර ගාස්තු	125	12,875
එකතුව	**41,480,562**	**52,733,222**

සටහන - 14		
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		
ආරම්භයේ දී ශේෂය	145,801,141	71,788,586
වසර සඳහා ගෙවීම	(3,819,832)	(3,658,534)
වසර සඳහා ගැලපීම (ජීවගණක/ අලාභය)	(30,214,196)	
වසර සඳහා අය කිරීම	20,636,130	77,671,088
එකතුව	**132,403,242**	**145,801,140**

සටහන - 15	රු.	රු.
සීමා කළ අරමුදල් සහ පුදාන	**2020**	**2019**
NCAS පර්යේෂණ අරමුදල - වෛද්‍ය ඩබ්ලිව්. ඒ. එල්. වන්ද්‍රසිරි	111,299	111,299
දර්ශනශූරි පර්යේෂණ - ආර්.ඒස්.සී.ජී. රාජපක්ෂ මිය	1,645,000	-
ජී. පී. වික්‍රමාරච්චි පරිසංවාදය	1,178,551	1,305,638
සංවර්ධන ප්‍රථම උපාධි වැඩසටහන	1,214,142	1,214,142
ත්‍රෛභාෂා අරමුදල	114,450	114,450
පියසීලී වික්‍රමාරච්චි ජයසේකර	582,742	512,716
ත්‍යාග හා ප්‍රදාන	40,923,766	13,142,133
ක්‍රීඩා අරමුදල	314,540	314,540
පර්යේෂණ අරමුදල	1,439,234	1,428,874
අධ්‍යක්ෂකගේ අරමුදල	387,441	497,214
ජී. එස්. ඩී. සංවර්ධන ක්‍රියාකාරකම්	208,903	203,723
වික්‍රමාභිණී වැඩසටහන	83,640	83,640
ස්වර්ණමුදික වැඩසටහන	290,000	290,000
සංවර්ධන අරමුදල	10,000	10,000
වෛද්‍ය ලීලාරත්න අනුස්මරණ ශිෂ්‍යත්වය	116,150	111,591
ජී.පී. වික්‍රමාරච්චි අනුස්මරණ ශිෂ්‍යත්වය	73,320	66,994
වෛද්‍ය සිසිර වික්‍රමාරච්චි ශිෂ්‍යත්වය	220,819	200,000
F.G.S. අරමුදල	31,240	26,060
සංවර්ධන අරමුදල (ශල්‍යශාලකාර්‍ය)	9,000	9,000
එකතුව	**48,954,236**	**19,642,014**

සටහන - 16		
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනන සංචිතය සහ වෙනත්		
ස්ථාවර වත්කම්	196,103,517	141,060,834
මෝටර් වාහන ප්‍රත්‍යාගනන සංචිතය	24,832,651	24,832,651
ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීමේ අරමුදල	452,960	1,442,959
	221,389,128	**167,336,444**

සටහන - 17	2020	2019
විවිධ ලැබීම්		
විවිධ ආදායම	945,586	533,058
ලියාපදිංචි ගාස්තුව (සැපයුම්කරුවන්)	186,000	94,000
එකතුව	**1,131,586**	**627,058**

සටහන - 18		
දේපළ කුලිය		
ආපනශාලාවලින් කුලිය	10,000	6,500
දේපළවලින් කුලිය	176,257	341,445
එකතුව	**186,257**	**347,945**

සටහන - 19		
ශිෂ්‍යාධාර සහ මහලොළු		
ශිෂ්‍යාධාරවලින් ලැබීම්	7,652,430	3,309,930
ශිෂ්‍යාධාර ගෙවීම්	(7,652,430)	(3,309,930)
මහපොළින් ලැබීම	-	3,760,650
මහපොළ ගෙවීම්	-	(3,760,650)
ශුද්ධ	**-**	**-**

*** සටහන**

2020 වර්ෂය තුළ දී මහපොළ භාරකාර අරමුදල මගින් මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් එක් එක් ශිෂ්‍යයාගේ බැංකු ගිණුමට සෘජුවම බැර කරන ලදී.

කැළණිය විශ්වවිද්‍යාලය
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
ව්‍යාපෘති සහ වැය විෂය අනුව වැඩසටහන් වියදම - 2020

ක්ෂේත්‍ර අංකය	විස්තරය	සාමාන්‍ය පරිපාලනය 01-01	මූල්‍ය පරිපාලනය 01-02	අධ්‍යයන සේවා 02-11	ශික්ෂණ සම්පත් 03-01	එකතුව
01	**පුද්ගලික වැටුප්**					
01	පුද්ගලික වැටුප්- අධ්‍යයන					
01.01	වැටුප් හා වේතන	-	-	39,498,129.05	1,654,055.34	41,152,184.39
01.02	යූ. පී. එෆ්.	-	-	10,636,745.12	289,927,.81	10,926,672.93
01.03	විශ්‍රාම වැටුප්			4,431,845.14	331,346.17	4,763,191.31
01.04	සේ.අ.ආ.			3,013,718.50	124,254.84	3,137,973.34
01.05	වැඩ බැලීමේ ගෙවීම්					-
01.06	අධ්‍යයන දීමනා			57,691,177.01	2,326,715.56	60,017,892.57
01.07	සම කිරීමේ දීමනා			-	-	-
01.08	ජීවන වියදම් දීමනාව			3,276,000.00	161,283.87	3,437,283.87
01.09	වෙනත් දීමනා			123,934.35	-	123,934.35
01.10	භාෂා ප්‍රවීණතා දීමනාව					-
01.11	බාහිර කථිකාචාර්ය ගාස්තු			788,588.00	-	788,588.00
01.14	පාරිතෝෂික					-
01.15	වෙනත් දීමනා 5%					-
01.16	පර්යේෂණ දීමනා			13,277,859.58	413,014.00	13,690,873.58
01.17	සංග්‍රහ දීමනා					-
01.18	දේපළ ණය			465,288.59	-	465,288.59
01.19	20% දීමනාව			7,833,691.85	330,765.42	8,164,457.27
01.22	දීමනාව 10000					-
2	**පුද්ගලික වැටුප්- අනධ්‍යයන**					-
02	පුද්ගලික වැටුප්					-
1.02.01	වැටුප් හා වේතන	28,575,251.19	8,832,446.65	26,647,222.91	4,375,398.86	68,430,319.61
1.02.02	යූ. පී. එෆ්.	4,545,672.45	1,504,647.65	4,175,213.67	795,219.50	11,020,753.27
1.02.03	විශ්‍රාම වැටුප්	2,263,915.70	660,443.82	1,956,538.64	305,584.06	5,186,482.22
1.02.04	සේ.භා.අ.	1,361,917.97	433,018.55	1,211,181.67	220,160.73	3,226,278.92
1.02.05	වැඩ බැලීමේ ගෙවීම්	-	102,568.59	-	-	102,568.59
1.02.08	ජීවන වියදම් දීමනාව	5,060,024.54	1,400,418.71	4,658,241.67	896,748.39	12,015,433..31
1.02.09	වෙනත් දීමනා	243,544.00	22,877.16	69,000.00	-	335,421.16
1.02.12	අතිකාල දීමනා	2,795,536.47	134,435.20	-	225,211.05	3,155,182.72
1.02.13	නිවාඩු ගෙවීම්	143,971.94	11,934.75	19,589.57	-	175,496.26
1.02.14	පාරිතෝෂික	20,636,130.05	-	-	-	20,636,130.05
02.15	5% වෙනත් දීමනා	-	-		-	-
02.16	පර්යේෂණ දීමනා	687,451.10	-	-	-	687,451.10
02.17	දේපළ ණය	373,850.87	62,365.66	175,685.85	85,633.40	697,535.78
02.18	20% දීමනාව	5,391,672.13	1,922,507.20	3,672,076.14	1,228,533.56	12,214,789.03
02.20	20% දීමනාව	12,125,650.93	4,044,886.19	8,529,798.86	2,757,453.94	27,457,789.92
02.21	දීමනාව 10000	-	-	-	-	-
02.23	ප්‍රවාහන දීමනාව	8,617.74	-	-	-	8,617.74
02.01	දේශීය	103,680.00	2,022.50	7,805.00	31,235.92	144,743.42
02.02	විදේශීය (සප්ත වාර්ෂික, සම්මන්ත්‍රණ ආදී)	-	-	-	-	-
03.01	ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	1,055,506.46	239,710.11	635,770.55	19,994.72	1,950,981.84
03.02	ඉන්ධන හා ලිහිස්සි ද්‍රව්‍ය	1,329,268.84	-	-	-	1,329,268.84
03.03	නිල ඇඳුම් හා මැහුම් ගාස්තු	212,003.36	12,096.72	170,761.88	-	394,861.96
03.04	යාන්ත්‍රික හා විද්‍යුත් භාණ්ඩ	-		-		

03.05	රසායනික හා විදුරු භාණ්ඩ	-		3,142.50	-	3,142.50
03.06	වෛද්‍ය සැපයුම්	-		202,059.83	-	202,059.83
03.07	වෙනත් සැපයුම්	816,570.40	28,167.75	643,948.38	40,487.75	1,529,174.28
04.01	වාහන	1,063,604.74	-	-	-	1,063,604.74
04.02	පිරියත, යන්ත්‍ර හා උපකරණ	468,625.15	226,024.76	170,286.54	7,004.84	871,941.29
04.03	ගොඩනැගිලි හා ව්‍යුහ	499,221.80	-	-	-	499,221.80
04.04	ගෘහ භාණ්ඩ	-	-	-	-	-
04.05	වෙනත්	2,084.00	-	-	-	2,084.00
05.01	ප්‍රවාහනය	73,884.00				73,884.00
05.02	ජනසන්නිවේදනය	1,414,510.61	98,991.05	3,489,771.34	3,265.90	5,006,538.90
05.03	තැපැල් ගාස්තු	88,260.00	-	-	-	88,260.00
05.04	විදුලිය	5,569,558.83	-	-	-	5,569,558.83
05.05	ආරක්ෂක සේවා	14,356,116.90	-	-	-	14,356,116.90
05.06	ජලය	1,403,962.03	-	-	-	1,403,962.03
05.07	පිරිසිදු කිරීමේ සේවා	5,829,925.85	-	-	-	5,829,925.85
05.08	කුලී හා කුලී ගාස්තු	-	-	-	-	-
05.09	කුලී හා පළාත් පාලන ආයතනවලට බදු	6,244,784.83	-	-	-	6,244,784.83
05.10	මුද්‍රණ, දැන්වීම් ආදිය	1,832,904.80		4,821.00	28,825.00	1,866,550.80
05.11	වෙනත්	-	-	-	-	-
06.01	විශ්වවිද්‍යාල ගුරුවරුන් සඳහා ප්‍රවාහන ප්‍රදාන	-	-	-	-	-
06.02	විශේෂ සේවා - කවුන්සිල හා කමිටු	695,000.00	98,000.00	39,000.00	-	832,000.00
06.03	විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් ගාස්තු	1,797,620.38	71,000.00	175,500.00	18,000.00	2,062,120.38
06.04	වැඩමුළු, සම්මන්ත්‍රණ	21,000.00	39,000.00	52,500.00	15,000.00	127,500.00
06.05	අධ්‍යයන පර්යේෂණ	-	-	-	-	-
06.06	කාර්ය මණ්ඩල සංවර්ධනය (ගුරුවරුන් සඳහා පුහුණුව)	-	-	15,286.00	-	15,286.00
06.07	පශ්චාත්උපාධි පර්යේෂණ හා ශිෂ්‍යත්වය	-	-	-	-	-
06.08	ශිෂ්‍යයින් හා ඉගෙනුම් සඳහා පාඨමාලා ලේඛණ	-	-	2,627,411.00	-	2,627,411.00
06.09	කර්මාන්ත ආධුනිකත්ව, ප්‍රායෝගික පරීක්ෂණ හා වෘත්තීය උපදේශනය	-	-	-	-	-
06.10	ශිෂ්‍ය සංවර්ධනය. මූලාරම්භයන් හා කමිටු	-	-	40,202.00	-	40,202.00
06.11	විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු	-	-	-		
06.12	ශිෂ්‍ය සුභසාධනය, සේවානියුක්ති සුභසාධනය, ශිෂ්‍ය කවුන්සිල	-	-	-	-	-
06.13	සංයුක්ත සැලැස්ම, පාලනය හා දිගුව	-	-	-	-	-
06.14	වෙනත් සංවිධානවලට ප්‍රදාන	-	-	-	-	-
06.15	නිවාඩු ගමන් බලපත්‍ර හා වාර ප්‍රවේශපත්‍ර	57,235.60	10,243.90	77,251.70	2,048.80	146,780.00
06.16	සංග්‍රහ වියදම්	221,982.00	13,084.50	59,620.00	-	294,686.50
06.17	බැංකු ගාස්තු	-	-	-	-	-
06.18	ප්‍රදාන හා හානිපූරණ	-	-	-	-	-
06.19	දායකත්වය හා සාමාජික ගාස්තු	-	-	-	-	-
06.20	උපාධි ප්‍රදානෝත්සවය	-	-	-	-	-

06.21	විභාග වියදම්	-	-	1,904,802.88	-	1,904,802.88
06.22	වෙනත් - පුවත්පත්, වාරසඟරා ආදිය	645,847.50	50,100.00	494,563.00	136,875.00	1,327,385.50
06.23	පශ්චාත්උපාධි පාඨමාලා වියදම්	8,390,550.94	-	-	-	8,390,550.94
06.24	සංග්‍රහ දීමනා	-	-	269,174.35	-	269,174.35
06.25	උත්පාදිත අරමුදල් වියදම්	1,507,699.05	-	-	-	1,507,699.05
07.01	මහපොළ ශිෂ්‍යත්වය	-	-	-	-	-
07.02	ශිෂ්‍යාධාර	-	-	-	-	-
08	**ක්ෂයවීම**					-
1801	ගොඩනැගිලි	12,864,530.29	-	-	-	12,864,530.29
1802	ගෘහභාණ්ඩ හා තිරවුරු	2,154,038.91	-	-	-	2,154,038.91
1805	පිරියත හා යන්ත්‍රසූත්‍ර	2,082,497.91	-	-	-	2,082,497.91
1806	කාර්යාල උපකරණ	7,410,683.34	-	-	-	7,410,683.34
1807	පුස්තකාල පොත්	457,003.88	-	-	-	457,003.88
1808	මෝටර් රථ	4,890,442.31	-	-	-	4,890,442.31
1809	විද්‍යාගාරය හා ශික්ෂණ උපකරණ	3,703,514.19	-	-	-	3,703,514.19
	එකතුව	**173,477,325.98**	**20,020,991.42**	**203,235,204.12**	**16,824,044.43**	**413,557,565.95**

මහපොළ සහ ශිෂ්‍යාධාර හැරුණු කොට මුළු වටිනාකම 421,209,995.95

අයවැය හා තථ්‍ය සැසඳීම - 2020

	2020 අයවැය රු.	අතිරේක වෙන්කිරීම් මාරු කිරීම රු.	මුළු සංශෝධිත අයවැය රු.	2020 තථ්‍ය වියදම් රු.
මෙහෙයුම් ආදායම				
පුනරාවර්තන ප්‍රදාන	392,413,000	-	-	391,538,000
වෙනත් ප්‍රදාන	-	-	-	-
	392,413,000		**-**	**391,538,000**
වෙනත් ආදායම			-	
(1) ණය හා අත්තිකාරම්වලින් පොලිය	875,000		-	737,598
(2) විවිධ ලැබීම්	80,000		-	1,131,586
(3) ආයෝජනවලින් පොලිය	17,145,000		-	17,733,336
(4) ලියාපදිංචි ගාස්තු	100,000		-	371,000
(5) විභාග ගාස්තු	35,000		-	25,300
(6) පුස්තකාල දඩ	25,000		-	22,019
(7) වෛද්‍ය ගාස්තු	10,000		-	2,000
(8) දේපලවලින් කුලිය	125,000		-	186,257
(9) පැරණි තොග අලෙවිය	-		-	1,913
(10) පාඨමාලා ආදායම	635,000		-	13,536,282
එකතුව	**19,030,000**		**-**	**33,747,291**
	411,443,000		**-**	**425,285,291**
			-	
මෙහෙයුම් වියදම්			-	
(1) පුද්ගලික පඩිනඩි	328,109,000		-	312,018,590
(2) ගමන් වියදම්	745,000		-	144,743
(3) සැපයුම් හා භාවිතා කළ පරිභෝජන භාණ්ඩ	11,157,000		-	5,409,489
(4) නඩත්තු	2,407,000		-	2,436,852
(5) කොන්ත්‍රාත් සේවා	52,189,000		-	40,439,582
(6) ක්ෂයවීම			-	33,562,711
(7) උත්පාදිත අරමුදල් වියදම්			-	1,507,699
(8) වෙනත් මෙහෙයුම් වියදම්	15,256,000		-	9,647,349
(9) පාඨමාලා වියදම්	1,580,000		-	8,390,551
එකතුව	**411,443,000**		**-**	**413,557,566**
			-	
ප්‍රාග්ධන වියදම්			-	
පුනරුත්ථාපන හා ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම	48,250,000		-	20,051,723
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	13,750,000		-	6,115,923
ඉදිකිරීම් ව්‍යාපෘති - අඛණ්ඩ (වෙනත්)	45,000,000		-	46,063,209
ඉදිකිරීම් ව්‍යාපෘති - නව			-	-
පර්යේෂණ හා සංවර්ධනය			-	
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය	1,000,000		-	
	108,000,000		**-**	**72,230,855**
	519,443,000		**-**	**485,788,421**

සටහන්

1. අයවැය කෘත්‍ය වර්ගීකරණය මඟින් මුදල් පදනම මත අනුමත කරනු ලැබේ. අනුමත කළ අයවැය මඟින් 2020 ජනවාරි මස 01 දින සිට 2020 දෙසැම්බර් මස 31 දක්වා මූල්‍ය වර්ෂය ආවරණය කරනු ලබයි.
2. අයවැය සහ ගිණුම්කරණ පදනම් වෙනස් වේ. සමස්ත ආණ්ඩුවේ කටයුතු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇති වියදම් ස්වභාවය මත පදනම් කර ගත් වර්ගීකරණයක් භාවිතා කරමින් උපචිත පදනම මත සකස්කර ඇත. මූල්‍ය ප්‍රකාශන 2020 ජනවාරි මස 01 දින සිට 2020 දෙසැම්බර් මස 31 දක්වා මූල්‍ය වර්ෂය සඳහා සකස් කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශන අයවැයට වඩා වෙනස් වේ.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - යක්කල

2020

තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - යක්කල

01. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා නිකුත් කරන ලද පහත චක්‍රලේඛ මඟින් එම කරුණු පිළිබඳව විද්‍යායතනය දැනුවත් වූ අතර විද්‍යායතනයේ ඉදිරි සැළසුම් සකස් කිරීමේදී එම අරමුණ සාක්ෂාත් කර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ඒ අනුව සකස් කෙරිනි.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2017 චක්‍රලේඛය

ජාතික අයවැය දේපාර්තමේන්තුවේ අංක BD/CBP/4/1/2-2018 දරණ 2017.07.31 දිනැති ලිපිය

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරණ 2017.08.14 දිනැති ලිපිය

02. උක්ත චක්‍රලේඛ, ලිපි සහ වෙනත් මාධ්‍ය මඟින් වසර 2030 න්‍යාය පත්‍රයේ අප විද්‍යායතනයට අයත් සහ එහි දැක්ම සහ මෙහෙවර යටතේ අදාල වන කොටස් වෙත අවධානය යොමු විය. ඒ අනුව එම අරමුණු 17 න් 4 වන අරමුණ වන ගුණාත්මක අධ්‍යාපනයක් යන්න මූලික වශයෙන් හඳුනාගන්නා ලදී. ඒ යටතේ විද්‍යායතනයේ ප්‍රථම උපාධිය සඳහා සිසුන් 120 ක් බඳවා ගැනීම, විද්‍යායතනය මඟින් සිදු කරන ප්‍රථම උපාධි මට්ටමට පහළ පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් බඳවා ගැනීම, ඒවායේ ගුණාත්මක බව ඉහළ නැංවීම සහ නව පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කිරීම, සිසුන්ගේ සහ සේවකභවතුන්ගේ සුභසාධක පහසුකම් සහ භෞතික සම්පත් වැඩිදියුණු කිරීම ආදී කරුණු දක්විය හැකිය.

03. මෙම අරමුණු සහ ඉලක්ක සහ මිනුම් දර්ශක (KPI) ආයතනයේ 2020 වර්ෂයේ සැලසුම් වෙත ඇතුළත් කර ඇත. තවද රජය විසින් තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ නව ප්‍රතිපත්තිමය උපාය මාර්ග 03 ක් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වා ඇත. එනම් 1. තිරසර සංවර්ධන අරමුණු 2. ස්ත්‍රී පුරුෂ සමානභාවයට අනුකූල වූ අයවැයකරණය 3. ආබාධිත පුද්ගලයන් සවිබල ගැන්වීම කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් කටයුතු කිරීමට උත්සහ දරා ඇත. ඒ අනුව යමින් මෙම විද්‍යායතනයේ කළමනාකරණ උපාය මාර්ගික සැළැස්ම ද සකස් කර ඇත.

ඉලක්කය	පරමාර්ථය	පියවර	ප්‍රධාන කාර්යසාධන දර්ශක	තිරසාර සංවර්ධන ඉලක්ක
1 ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය බවට පත්වීම	1.1 අධ්‍යයන විශිෂ්ටතාව ඉහළ නැංවීම	1.1.5 ප්‍රජා පාදක සේවා ඉගෙනුම් ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම	ප්‍රජා පාදක ව්‍යාපෘති සඳහා වෙන් කළ කාලයෙන් %	සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම
		1.1.3.1 තාක්ෂණික විෂයධාරාව සඳහා නව ප්‍රථම උපාධි වැඩසටහන් පිරිනැමීම	ආරම්භ කළ පාඨමාලා සංඛ්‍යාව	සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම සහ 4වැනි ඉලක්කය
		1.1.3.2 නව විහිදුම් පාඨමාලා පිරිනැමීම	ආරම්භ කළ පාඨමාලා සංඛ්‍යාව	
		1.1.3.3 නව පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා වැඩසටහන් පිරිනැමීම	ආරම්භ කළ පාඨමාලා සංඛ්‍යාව	
		1.1.3.4 දැනට ඇති වැඩසටහන් සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ නැංවීම	ලියාපදිංචි කළ ශිෂ්‍ය සංඛ්‍යාව	

		1.1.3.5 ශිෂ්‍ය හැරයාම අඩු කිරීම	වසරකට හැරයන ශිෂ්‍යයින් සංඛ්‍යාව	
		1.1.3.6 සාම්ප්‍රදායක වෛද්‍ය වෘත්තිකයින්ට වෘත්තීය අධ්‍යාපනයට ප්‍රවේශවීමට ඉඩප්‍රස්ථා සැලසීම	සාම්ප්‍රදායක වෛද්‍ය වෘත්තිකයින් සංඛ්‍යාව. වසරකට ලියාපදිංචි කළ %	
	1.3 ප්‍රමිති, සායන හා වෘත්තීය පුහුණුව හරහා ආයුර්වේද අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම	1.3.1.2 විවිධ ප්‍රදේශවල සායනික පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම/ පුළුල් කිරීම	පවත්වන ලද සායනික පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	
		1.3.1.3 වෘත්තීය පුහුණුව වැඩිදියුණු කිරීම/ පුළුල් කිරීම	පවත්වන ලද වෘත්තීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	
2 ශ්‍රී ලංකාව තුළ ආයුර්වේදය පිළිබඳ විශිෂ්ට පර්යේෂණ මධ්‍යස්ථානයක් බවට පත්වීම	2.1 ප්‍රමිති, සායන හා වෘත්තීය පුහුණුව හරහා ආයුර්වේද අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම	2.1.2.2 බහු-විෂය පර්යේෂණ දිරිමත් කිරීම	වසරක දී සිදු කළ බහු-විෂය පර්යේෂණ සංඛ්‍යාව	සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම
		2.1.2.3 විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන ආදිය සමඟ පර්යේෂණ සහයෝගීතාවන් ඇති කර ගැනීම	වසරක දී ඇති කර ගත් සහයෝගීතා සංඛ්‍යාව	
5 ආයුර්වේදය, යුනානි සහ සිද්ධි යන වෛද්‍ය ක්‍රම තුනේ නියැලි ශිෂ්‍යයින් සහ වෘත්තිකයින් අතර සන්නිවේදනය, අන්තර්ක්‍රියාකාරීත්වය සහ අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා වැඩි අවස්ථාවන් නිර්මාණය කිරීම	5.1 ආයුර්වේදය, යුනානි සහ සිද්ධි යන ප්‍රධාන සාම්ප්‍රදායක වෛද්‍ය ක්‍රම තුන අතර සහයෝගීතාව වැඩිදියුණු කිරීම මඟින් ආචාරවිද්‍යාත්මක සංගතිය ප්‍රවර්ධනය කිරීම	5.1.1.1 උසස් අධ්‍යාපන ආයතන අතර ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන් පැවැත්වීම	"වසරක දී පවත්වන ලද හුවමාරු වැඩසටහන් සංඛ්‍යාව"	සෞඛ්‍ය හා අධ්‍යාපනය සහ සාමය ගොඩනැගීම සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම (16වැනි ඉලක්කය)
		5.1.1.2 බහු-විෂය පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම	වසරක දී පවත්වන ලද බහු-විෂය පර්යේෂණ සංඛ්‍යාව	
		5.1.1.3 යුනානි හා සිද්ධි වෛද්‍ය ක්‍රම පිළිබඳ ඒකාබද්ධ සෞඛ්‍ය කඳවුරු/ පුහුණු වැඩසටහන් පැවැත්වීම	වසරක දී පවත්වන ලද ඒකාබද්ධ සෞඛ්‍ය කඳවුරු සංඛ්‍යාව	

		5.1.1.4 යුනානි හා සිද්ධි වෛද්‍ය ක්‍රම පිළිබඳ ඒකාබද්ධ විනෝදක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද විනෝද ක්‍රීඩා වැඩසටහන් සංඛ්‍යාව	
6 කාර්යක්ෂම හා ඵලදායී පරිපාලන හා මූල්‍ය කළමනාකරණයක් හරහා පාලනය ඉහළ නැංවීම	6.1 වසර 2020 දී කාර්යක්ෂම පාලන ක්‍රමයක්	6.1.1.3 අධ්‍යයන ගොඩනැගිල්ලක් ඉදිකිරීම (AC2)	ඉදිකිරීම් කටයුතුවලින් %ක් නිමා කර ඇත.	ආබාධිත පුද්ගලයින් ට ඇති ප්‍රවේශය ඉහළ නැංවීම සහ 4වැනි ඉලක්කය
		6.1.2.7 හරිත හා තිරසාර මූලාරම්භයන් ප්‍රවර්ධනය කිරීම	හඳුන්වා දෙන ලද හරිත මූලාරම්භ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	7වැනි ඉලක්කය

04. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා 2020 වසරේදී පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන් මෙම විද්‍යායතනය මඟින් ගෙන තිබේ.

(I) විද්‍යායතනයේ දෛනික රාජකාරී කටයුතු සඳහා ආයතනික දායකත්වය ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රම බලකාය වෙත බඳවාගැනීම් සිදු කිරීමේදීත් පුරප්පාඩු පිරවීමේදීත් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කිරීම.

(II) එමෙන්ම විද්‍යායතනයේ කාර්යය මණ්ඩල සාමාජිකාවන්ගේ ආරක්ෂාවට වඩාත් හිතකර වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා රාත්‍රී 6 න් පසුව රාජකාරී කටයුතු සිදු කිරීම අවම කිරීමට කටයුතු යොදා ඇති අතර අත්‍යවශ්‍යම අවස්ථා වලදී පමණක් රාත්‍රී 6 න් පසුව රාජකාරී කටයුතු වල යෙදවීමට සිදු වුවහොත් ඔවුන්ගේ ගමනාන්ත සඳහා ප්‍රවාහන පහසුකම් සපයා දීමට කටයුතු යොදා ඇත.

(III) එමෙන්ම කාර්යයන් ඉටු කිරීමේදී ඉතා සමාන කාර්යයභාර්යයක් කාන්තා නිළධාරීන් වැඩි දෙනෙක් අතරේ බෙදා දීම මඟින් රාජකාරී කාලය තුළ ඉතා කාර්යක්ෂමව තමන් වෙත පවරා ඇති රාජකාරී කටයුතු ඉටු කළ හැකි වැඩ පරිසරයක් නිර්මාණය කර ඇත.

05. දත්ත පවත්වා ගැනීම යටතේ සේවකයන් පිළිබඳ දත්තයන් පාලන අංශයෙන් ද සිසුන් පිළිබඳ දත්තයන් විභාග සහ ශිෂ්‍ය සුභසාධන අංශය යටතේ ද පවත්වාගෙන යනු ලබයි. තවද අප ආයතනයේ ද ස්ත්‍රී පුරුෂභාවය වෙන් කර දත්ත ලබා ගැනීම සඳහා තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යනු ලැබේ.

06. එමෙන්ම තිරසාර සංවර්ධන අරමුණු යටතේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යටතේ ස්ත්‍රී, පුරුෂ, ජාති, ආගම්, කුල බේදයකින් තොරව උසස් අධ්‍යාපනය ලබා ගැනීමට සහ එමගින් ළඟා කර ගත හැකි ප්‍රතිඵල අත් විඳීමට සම අවස්ථාවන් මෙම විද්‍යායතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ළඟා කර දීමට කටයුතු යොදා ඇත.

07. එමෙන්ම පරිසරය රැක ගැනීමටත් ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමටත් භූමි බාදනය වළක්වා ගැනීමටත් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ කාර්යය මණ්ඩලය විසින් සුවිශේෂී කැප වීමක් කොට තිබේ.

(I) විද්‍යායතනයේ විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වන ඖෂධ ශාක රෝපනය කිරීම හා ඒවා හොඳින් රැක බලා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් වතුපිටිවල පිහිටි අක්කර 6 ක භූමී භාගයක ඖෂධ උද්‍යානයක් ද පවත්වා ගෙන යනු ලැබේ. 2020 වසරේ ජනවාරි පළමු දින ඖෂධ පැළ වර්ග සිටුවීමට මූලිකත්වය දී රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබා දී ඇත.

- විද්‍යායතනයට වසර අනූ එකක් පිරීම නිමිති කොට ගෙන විද්‍යායතනයේ සහ වතුපිටිවල ඔසු උයනේ ඔසු පැළ රෝපණය කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. (කොහොඹ, කුඹුක්, යකිනාරං, දෙහි, වරා, සේපාලිකා, කරාබු නැටි, සුදු හඳුන්, ලොවි, ඇහැල, නෙල්ලි, කරඳ, නා, තෙබු ආදී ඔසු පැළ 55 ක් පමණ).

- විද්‍යායතනය තුළ එකතු වන ශාක පත්‍ර එකතු කිරීම මගින් කොම්පෝස්ට් සෑදීමේ ක්‍රියාවලියකට යොමු කිරීම. (එම කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය විද්‍යායතනයේ සහ වතුපිටිවල ඔසු උයනෙහි පැළ සඳහා පොහොර වශයෙන් යෙදීමට කටයුතු යොදා ඇත).

- විද්‍යායතනයේ නව පරිපාලන ගොඩනැඟිල්ලෙහි ඉදිරි පිවිසුම් පරිශ්‍රයෙහි නා පැළ රෝපණය කිරීම.

(II) පරිසර සංරක්ෂණයට දායක වීමේ අරමුණින් වාර්ෂිකව ඖෂධ පැළ සිටුවීමේ ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක කර ඇති අතර විද්‍යායතනයේ සිසුන් විසින් වාර්ෂිකව සංවිධානය කරන ලද ඖෂධ පැළ බෙදා දීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කොට ඇත.

(II) එමෙන්ම කැළි කසළ පරිසරයට බැහැර කිරීමෙන් වන පරිසර හානි අවම කිරීම සඳහා විද්‍යායතනයේ එක් රැස් වන කසළ රැස් කොට කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ද මේ වන විට අරඹා ඇති අතර ඉන් ලබා ගන්නා කාබනික පොහොර විද්‍යායතයේ වගාවන් සඳහා භාවිතා කරමින් පරිසර හිතකාමී වටපිටාවක් සකස් කිරීම සඳහා ඉමහත් කැපවීමක් කරනු ලැබේ.

* 2020 මාර්තු මස සිට මැයි මාසය දක්වාත් 2020 ඔක්තෝබර්, නොවැම්බර් යන මාස වලදී ප්‍රදේශයේ සහ රට තුළ පැවති කොරෝනා උවදුර හේතුවෙන් ඇතැම් හඳුනාගත් ඉලක්ක වෙත ගමන් කිරීමට යම් කාල බාධාවක් පැවතිනි.

08. සෑම වසරක් අවසානයේදීම ඉදිරි වසරේ තීරණ සහ ඉලක්ක සඳුනා ගැනීම උදෙසා මෙම කාර්යයන් හි ප්‍රගතිය මැන බැලීමට අදාළ තොරතුරු ලබා ගැනීම සිදු කෙරේ. එමෙන්ම මෙම විද්‍යායතනයේ සේවක මණ්ඩලයට, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හිතකර මානසික සුවයක් ලැබෙන පරිදි ආයතන පරිශ්‍රය වඩාත් හරිත පැහැයෙන් පවත්වාගෙන යාම සඳහා ගත හැකි සෑම පියවරක්ම විද්‍යායතනයේ ඉහළ කළමනාකාරීත්වයේ උපදෙස් මත 2020 වසරේ ගෙන ඇති බව සතුටින් කිව හැකිය.

15. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/E/GWAI/01/20/09
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 මැයි 21 දින

උපකුලපති
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.108,343,085 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණු අතර ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) දේපල, පිරියත හා උපකරණ වල ඇතුළත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමකින් තොරව වාර්ෂිකව සියයට 10 බැගින් ක්ෂය කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විද්‍යායතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විද්‍යායතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව

මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විද්‍යායතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විද්‍යායතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විද්‍යායතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විද්‍යායතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විද්‍යායතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) කාන්තා නේවාසිකාගාරය ඉදිකිරීමේ කාර්යය 2017 වර්ෂයේදී ආරම්භ කර රු.572,000 ක් පමණක් වැය කර නිසි අනුමැතිය නොමැති වීම හේතුවෙන් අතරමග නවතා දමා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 200 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 156 ක් වූයෙන් පුරප්පාඩු 44ක් පැවතුණි. ඉන් ස්ථිර කථිකාචාර්ය කාර්යමණ්ඩලයේ පැවති පුරප්පාඩු 14 ක් පිරවීමට කටයුතු නොකර බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගෙන සමාලෝචිත වර්ෂය තුළ දී බාහිර කථිකාචාර්ය දීමනා ලෙස රු.788,588 ක් ගෙවා තිබුණි.

(ඇ) අරමුදල් හා ප්‍රදාන 19 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 2,400,358ක් වූ අරමුදල් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

16. 2020 වසරේ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
Gampaha Wickramarachchi University of Indigenous Medicine
கம்பஹா விக்ரமாராச்சி சுதேச மருத்துவப் பல்கலைக்கழகம்

GWUIM/IA/NAOQu./06/2021

2021.07.09

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

උක්ත කරුණ සම්බන්ධයෙන් එවනු ලැබූ ඔබගේ අංක එච්ඊඩී/ඊ/පීඩබ්ඒයි/01/20/09 දරණ 2021.05.21 දිනැති 2020 වර්ෂයේ විගණකාධිපති වාර්තාව හා බැඳේ.

එම වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ 2021.07.08 දින පැවති ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 05 වන පාලක සභා රැස්වීමේදී සළකා බැලීමෙන් අනතුරුව පහත පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) විශ්වවිද්‍යාලයේ ඉඩම් ගොඩනැගිලි, මෝටර් රථ යන වත්කම් 2019 වර්ෂයේ සිට තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර අවශ්‍ය පරිදි ගිණුම් වලට ගලපන ලදී. 2020.09.23 දින පැවැති විද්‍යායතනයේ 274 කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත කාර්යාල උපකරණ, විද්‍යාගාර උපකරණ හා යන්ත්‍ර උපකරණ යනාදිය 2020 වර්ෂය තුළදී තක්සේරු කිරීමට අවශ්‍ය කරන කමිටුපත් කරන ලදී. දැනට සියලුම පරිගණක උපාංග වලට අදාළ තක්සේරු කිරීම් කටයුතු නිමකර ඇති අතර, අනෙකුත් වත්කම් වලට අදාළ තක්සේරු කිරීම් කටයුතු දැනටමත් සිදුකරමින් පවතී. එම කටයුතු අවසන් වූ පසු නව විශ්වවිද්‍යාලයේ ආරම්භක දිනට 2021.03.01 ට එම වත්කම් නිසි පරිදි තක්සේරු කර ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

උපකුලපති: Vice Chancellor: 0332222739 | ලේඛකාධිකාරී: Registrar: 0773677848 | මූල්‍යාධිකාරී: Bursar: 0768406318 | සාමාන්‍ය: Genaral: 0332222748

(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම යටතේ අවසාන ගිණුම් වාර්තාවේ පිටු අංක 07 ට අනුව උපකරණ (Equipment) යටතේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කිරීම සටහන් කර ඇති අතර ඉදිරියේදී අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී මෙය වෙනම පැහැදිලිව සටහන් කිරීමට සටහන් කර ගන්නා ලදී.

1.3 විද්‍යායතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

1.4 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

1.5 මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.3 වෙනත් කරුණු

(අ) විද්‍යායතනය සඳහා කාන්තා නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා නිසි පරිදි අනුමත වූ ව්‍යාපෘතියක් යටතේ දැරීමට සිදුවූ ප්‍රාරම්භක වියදම් වෙනුවෙන් මෙම මුදල දැරීමට සිදුවිය. මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සකස් කර තිබූ නගර සැලසුම් ව්‍යාපෘතියට අනුව පහත්බිම් තත්ත්වයේ පවතින ඉඩම් කිසිදු සංවර්ධන කටයුත්තකට යොදා නොගැනීමට ගෙන තිබූ තීරණය අනුව, යෝජිත ඉඩම් ගොඩකර අදාළ ඉදිකිරීම් සිදුකිරීමට අවසර නොලැබීම මත මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නතර කරන ලදී. කෙසේ වූවද ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක වුවහොත් එහිදී මෙම දරන ලද මුදල ප්‍රාග්ධනිත කිරීමට හෝ එසේ නොමැති වුවහොත් මෙම මුදල් කපාහැරීමට ඉදිරියේදී කටයුතු කිරීමට නියමිතව ඇත.

(ආ) ගම්පහ ආයුර්වේද විද්‍යායතනයේ අනුමත කාර්යමණ්ඩලය 203 ක් වූ අතර 2020.12.31 වන විට එහි පුරප්පාඩු සංඛ්‍යාව 44 කි. එයින් රියදුරු පුරප්පාඩු 02ක් සඳහාත් විද්‍යාගාර සහායක පුරප්පාඩු 02 ක් සඳහාත් වෙනත් විශ්වවිද්‍යාල වලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා කරන ලද ස්ථාන මාරුවීම් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. 2020 වර්ෂය තුළ රටෙහි පැවති වසංගත රෝග තත්ත්වය හේතුවෙන් විද්‍යායතනයේ අධ්‍යයන කටයුතු සියල්ල මාර්ගගත ක්‍රමය ඔස්සේ (online) පවත්වා ගෙන ගොස් තිබුණි.

එසේම 2020.10.28 දින අංක 2199/12 අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් 2021.03.01 දින සිට විශ්වවිද්‍යාලයක් බවට පත්කිරීම සඳහා නියෝග ලබාදී

තිබුණි. එහිදී එම විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය, විද්‍යායතනයේ අවශ්‍යතාවයට වෙනස් වන බැවින් විශ්වවිද්‍යාලය වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයක් ලබා දීමට නියමිතව තිබූ බැවින් ද නව විශ්වවිද්‍යාලය ඇති වූවායින් පසුව විශ්වවිද්‍යාලයේ අවශ්‍යතා සොයා බලා ඉතිරි අධ්‍යයන හා අනධ්‍යයන පුරප්පාඩු සියල්ලම පිරවීම වඩාත් යෝග්‍ය බැවින් ද, කථිකාචාර්ය වැනි තනතුරු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පළකර ඉදිරි කටයුතු කිරීම සඳහා විශාල මුදලක් හා කාලයක් වැය වන බැවින් ද නව විශ්වවිද්‍යාලය ඇති වූවායින් පසුව එම තනතුරු පිරවීම විශ්වවිද්‍යාලයට වාසිදායක බැවින් එම තනතුරු පිරවීම තාවකාලිකව අත්හිටුවන ලදී. මේ වන විට නව විශ්වවිද්‍යාලය පිහිටුවා ඇති අතර පුරප්පාඩුව තිබූ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකරමින් පවතී.

(සැ) උපයෝජනය නොවූ අරමුදල් ලෙස දක්වා ඇති ක්‍රීඩා අරමුදල, පර්යේෂණ අරමුදල, අධ්‍යක්ෂක අරමුදල, සංවර්ධන අරමුදල, GSD සංවර්ධන ක්‍රියාකාරකම්, FGS අරමුදල හා සංවර්ධන අරමුදල (ශල්‍ය, ශාලාක්‍ය) සඳහා ප්‍රතිපාදන මෙම ආයතනයේ ක්‍රියාත්මක වන ස්වයං මූල්‍ය පාඨමාලා වලින් වෙන් කරන ලද මුදල් වන අතර, ආයතනයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් මෙම වෙන් කරනු ලැබූ මුදල් වරින් වර භාවිතයට ගනු ලබයි.

ජ්‍යෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ
උපකුලපති

පිටපත් :-
1. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
3. ලේකම් - මුදල් අමාත්‍යාංශය